2022

කාර්යසාධන වාර්තාව



ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
இலங்கை மதுவரித் திணைக்களம்
Excise Department of Sri Lanka

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2022

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් , ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද

PFD / RED / COPA / 2019 / 01 අංක දරණ **2020.01.30** දිනැති මාර්ගෝපදේශ අනුව සකස් කරන ලදී

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම	-	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
ආයතනයේ ලිපිනය	-	අංක 353 , කෝට්ටේ පාර , රාජගිරිය
වැය ශීර්ෂ අංකය	-	248 - සුරාබදු දෙපාර්තමේන්තුව
Email	-	excisen@slt.lk
Web	-	*www*.excise.gov.lk
Telephone No	-	0113-888022
Fax	-	0112-877890
පැය 24 ඇමතුම්	-	1913

පටුන

පිටු අංක

පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 3
1.2 සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අගයයන් 4
1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 7
1.4 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම 8

පරිච්ඡේදය - 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ 10
2.2 ඉදිරි ඉලක්ක සහ අභියෝග 13
2.3 සුභසාධනය 14

පරිච්ඡේදය - 03 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 16
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 18
3.4 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය- සුරාබදු නැගි අරමුදල 19
3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු නැගි අරමුදල 20
3.6 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - සුරාබදු නැගි අරමුදල 21
3.7 මූල්‍ය ප්‍රකාශ සටහන් 22
3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 22
3.9 මු.රෙ.208 ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 23
3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 23

පරිච්ඡේදය - 04 කාර්යසාධන දර්ශක

4.1 හැඳින්වීම 26
4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක 27

පරිච්ඡේදය - 05 තිරසාර සංවර්ධන අරමුණු (SDG) හඳුනා ගැනීමේ කාර්යසාධනය

5.1 හැඳින්වීම 30
5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය 31

පරිච්ඡේදය - 06 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය 38
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය 38
6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු 39
6.4 මානව සම්පත් සංවර්ධනය 42

පරිච්ඡේදය - 07 අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්යසාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව 48

පරිච්ඡේදය - 08 ඇමුණුම

8.1 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව
8.2 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - සුරාබදු නැගි අරමුදල

පරිච්ඡේදය - 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අඟයයන්

1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

1.4 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වසර එකසිය දහයක ඉතිහාසයක් ඇති රාජ්‍ය ආදායම් එකතු කරන ප්‍රමුඛතම ආයතනයකි. සුරාබදු, දුම්කොළ බදු සහ බීඩි දුම්කොළ බදු ආදායම් කළමනාකරණය, ඊට අදාළ නීති ක්‍රියාත්මක කිරීම හා සමාජ ආරක්ෂණය යන තෙවදෑරුම් මෙහෙවරයන් ඉටු කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.වර්ෂ 1912 සිට වසර එකසිය දහයක කාලය තුළ විශේෂ සිදුවීම් රැසක් වාර්තා වූ අතර, සමාලෝචිත 2022 වර්ෂය මෙම දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක වසරක් විය.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් ධුරයට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩල තීරණය මත මා 2023.01.02 දින පත් කරන ලදී. සමාලෝචිත 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තු මූලස්ථානයේ පරිපාලන හා අධීක්ෂණ කටයුතු සඳහා අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකු හා වැඩ බලන අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකු, ප්‍රධාන මූල්‍ය නිලධාරිනියක්, සුරාබදු කොමසාරිස්වරුන් දෙදෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරිවරයෙක් හා ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් හතර දෙනෙකු සහ පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු සේවය කරන ලදී.සුරාබදු ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන විගණන අංශයක්ද, අභ්‍යන්තර විගණන අංශයක්ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් අනුයුක්ත කරන ලද සංඛ්‍යාලේඛනඥවරියකගෙන් යුක්ත සංඛ්‍යාලේඛන අංශයක්ද පවතී.

සියලුම පළාත් ආවරණය වන සේ පිහිටි සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 13 ක්, සුරාබදු අධිකාරි කාර්යාල 30 ක්, සුරාබදු ස්ථාන 56 ක්, සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකක 05 ක් හා මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් සහිතව දෙපාර්තමේන්තුව දීප ව්‍යාප්ත සේවාවක් සපයයි. මීට අමතරව මද්‍යසාර හා දුම්වැටි නිෂ්පාදනාගාර ආශ්‍රිතව පිහිටි සුරාබදු ඒකක වලට ද ස්ථිර කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත.

2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ආදායම් ඉලක්කය රුපියල් බිලියන 180 කි.2022 වර්ෂයේ පළමු කාර්තුවේදී අපේක්ෂිත ඉලක්ක අභිබවා යාමට හැකි වුවද පැවති ඉන්ධන, ආර්ථික අර්බුදයන් සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් තුන්වන කාර්තුව ආරම්භයේ සිට අපේක්ෂිත සුරාබදු ආදායම් ඉලක්කය බිලියන 180 කරා යාමට අපහසු වුවත් රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය සඳහා අපේක්ෂිත සුරාබදු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 185 ක් ලෙස සංශෝධනය කරන ලදී. විවිධ අපහසුතා මධ්‍යයේ වුවද සුරාබදු ආදායම බදු අවකරණය (රුපියල් බිලියන 5.1) සහිතව රුපියල් බිලියන 170.3 ක් රැස්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවීම සතුටට කරුණකි. 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය,ඉන්ධන අර්බුදය,ආර්ථික අර්බුදය හා රටෙහි පැවති අස්ථාවර තත්ත්වය හේතුවෙන් සමස්ථ සේවක මණ්ඩලයට මුහුණ පෑමට සිදුවූ බලපෑම සහ සේවක හිඟය, 2022 වර්ෂයේ සමස්ත කාර්යසාධනය පහළ යාම කෙරෙහි සෘජුව බලපාන ලදී.

2022 වසරේදී සුරාබදු නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරන ලද නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වැටලීම් 35,381 ක් මත නඩු පවරන ලද අතර එමඟින් උපයා ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය රුපියල් 129,497,022 වේ. සුරාබදු බලපත්‍රලත් ස්ථානවල සිදුකළ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම් 4,155 වාර්තා වූ අතර, ඉන් අයකර ගත් සමථ මුදල් ප්‍රමාණය රුපියල් 164,831,863 කි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 1262 කි. පුරප්පාඩුව පැවති සේවක සංඛ්‍යාව 377 ක් වූ අතර, එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 23 %කි. මෙවැනි නිලධාරි හිඟයක් තුළ වුවද අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීමට හැකිවිය.

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටම්වල නිලධාරීන් 49 ක් සඳහා උසස්වීම් ලබා දීමට හැකිවූ අතර ද්විතීය මට්ටමේ තනතුරු 36 ක් සඳහා උසස්වීම් ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී. නවක සුරාබදු පරීක්ෂකවරුන් 38 දෙනෙකු සුරාබදු අභ්‍යාස විද්‍යාලයට අනුයුක්තව පුහුණුව ලබා දීමට කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ පැවති විවිධ අර්බුද හේතුවෙන් සමස්ත නිලධාරී පුහුණුවට යම් බාධා පැමිණියද උසස්වීම් ලද සියලුම නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීමට සුරාබදු අභ්‍යාස විද්‍යාලයට හැකියාව ලැබී ඇත.

ආදායම් කළමනාකරණය හා අපේක්ෂිත ආදායම් ඉලක්ක ඉටු කර ගැනීම සඳහා ආරක්ෂිත ස්ටිකර් ක්‍රමය 2022 වර්ෂය ආරම්භයේ සිට සිදු කළ අතර 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේදී මත්පැන් බෝතල් මත ස්ටිකර් ඇලවීම අනිවාර්ය කරන ලදී. එමගින් සැලකිය යුතු ආදායම් ඉහල යාමක් සිදු වුනි.

මෙම සමස්ත රාජකාරී ඉටු කිරීමේදී මුදල් අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයට අදාළ සියලුම නිලධාරීන්, ශ්‍රී ලංකා පොලිසිය , ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් සහාය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

2022 වර්ෂය තුළ පැවති ආර්ථික, ඉන්ධන අර්බුදයන් සහ රටේ පැවති අස්ථාවරභාවය සමස්ත රාජ්‍ය සේවයටම සිදු කල බලපෑම හේතුවෙන් යම් තරමකට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය අඩාල වුවද, එකි වර්ෂයට අදාළ ආයතනික කාර්යසාධන මට්ටම ඉහළ ප්‍රතිශතයකින් සපුරා ගැනීම සඳහා දෙන ලද සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලු සුරාබදු නිලයන්ගෙන්, ඒකාබද්ධ සහ දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගෙන් සමන්විත සමස්ත සුරාබදු කාර්ය මණ්ඩලය වෙත මාගේ කෘතඥතාවය මෙයින් පුදකරමි.

ජේ.එම්.එස්.එන්.ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

1.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර, පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අඟයයන්

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
Excise Department of Sri Lanka

"වගකීමෙන් සුරක්ෂාවට"
"Protection through responsibility"

දැක්ම

මත්පැන් හා දුම්කොළ කර්මාන්තය විධිමත්ව නියාමනය කිරීම තුළින් රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සඳහා කැප වූ වඩාත්ම ගෞරවනීය හා වගකිව යුතු රාජ්‍ය ආයතනය වීම.

මෙහෙවර

නීත්‍යානුකූල වෙළඳ ආදායම් උත්පාදනය සඳහා පහසුකම් සැලසීම තුළින් ද , ක්‍රියාත්මක කල හැකි සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම බලාත්මක කිරීම තුලින්ද , නීති විරෝධී මත්පැන්, අන්තරායකර ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය අනිසි භාවිතයට එරෙහිව තියුණු දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම තුළින් ද ප්‍රමිතියකට අනුකූල නොවූ මද්‍යසාර භාවිතය මගින් සිදුවන සෞඛ්‍ය උපද්‍රවයන්ගෙන් ආරක්ෂාව සහතික කිරීම තුළින් ද ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට සහය වීම සඳහා රට තුළ මත්පැන් සහ අනෙකුත් අනුමත මද්‍යසාර කාර්යක්ෂමව හා සඵලදායී ලෙස පරිපාලනය කිරීම.

පරමාර්ථ

- උපායමාර්ගික, මෙහෙයුම් සහ උපායික මට්ටම්වලදි ඵලදායි තීරණ ගැනීමට සහාය වීම සඳහා ආයතනික දර්ශනයක් ලෙස අනුකූලතාවය වැඩි දියුණු කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම තුළින් ආදායම් එකතු කිරීම උපරිම කිරීම.

- ආදායම උපරිම කර ගැනීම අරමුණු කරගත් දැනුම අඛණ්ඩව හුවමාරුකර ගැනීම මගින් අදාළ නීතිවලට පාර්ශවකරුවන්ගේ අනුකූලතාවය ඉහළ නැංවීම තුළින් වෙළඳාම සඳහා පහසුකම් සැපයීම.

- මත්පැන් සහ දුම්කොළ ආදායම පාලනය කිරීම සහ පහසුකම් සැපයීම අතර ඇති සමතුලිතතාවය ළඟා කර ගැනීම සඳහා මූලික වන අවදානම් කළමනාකරණ මූලධර්ම ඵලදායී ලෙස යෙදීම.

- සුරාබදු එකතු කිරීමේදී අවංකභාවය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගෙනයාම.

- මත්පැන් නිෂ්පාදනය හා විකිණීම, පරිපාක ස්ප්‍රීතු, ස්වභාවය වෙනස් කල ස්ප්‍රීතු සහ වෙනත් අනුමත මත්ද්‍රව්‍ය නියාමනය කිරීම.

- නීතිවිරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව තිරසාර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ දැනුවත් කිරීම් සිදු කිරීම.

- නීති විරෝධී ස්ප්‍රීතු ආසවනය හා බලපත්‍ර රහිතව රහසිගතව සිදු කරන ස්ප්‍රීතු ආසවනය වැළැක්වීමට නීති, රීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය තුළින් ප්‍රමාණවත් වෘත්තීය හා තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සිටින බව සහතික කිරීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සහ ධාරිතාවය වර්ධනය කිරීම.

- උපරිම තෘප්තිමත්භාවයකින් හා මනා පුහුණුවකින් යුතුව සේවයට කැපවුණ කාර්යය මණ්ඩලයක් පවත්වා ගෙන යාම.

- මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම.

- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් වෙළඳාම පිටු දැකීමට කටයුතු කිරීම හා ඒවා භාවිතයෙන් මහජනයා ආරක්ෂා කර ගැනිම.

- මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් බාහිර ආයතන සමඟ මනා සම්බන්ධතාවයකින් සහ කාර්යක්ෂම බදු ක්‍රමයක් පවත්වා ගෙන යාම.

කාර්යයන් හා අගයයන්

කාර්යයන්

- සුරාබදු බලපත්‍රලාභී සියලුම පරිශ්‍රයන් අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ඉන් ලැබෙන ආදායම් එකතු කිරීම.
- සුරාබදු ආඥාපනත , දුම්කොළ බදු පනත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.
- වස විෂ, අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.
- ජාතියේ සමාජ ආරක්ෂාව සඳහා ජාතික දුම්කොළ සහ මද්‍යසාර අධිකාරිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ පොලිස්, රේගු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි වෙනත් නීති ක්‍රියාත්මක කරන ආයතන සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට එරෙහිව ආයතනික වැඩසටහන් හරහා දැනුවත් කිරීම හා නීති විරෝධී මත්පැන් හා අන්තරායකර ඖෂධවල හානිය පිළිබඳ සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම.
- 2008 අංක 01 දරණ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක මත්ද්‍රව්‍යවල නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම.
- සැලසුම් කල වර්ෂය තුළ සියලුම මට්ටමේ සේවකයන් සඳහා පුහුණුව ලබා දීම.
- රැස්වීම්, සාකච්ඡා සඳහා සියලුම පාර්ශවකරුවන් සමඟ ක්‍රියාකාරී සහභාගිත්වය.

අගයයන්

- සැමට එකලෙස සලකන මිත්‍රශීලි හා විනිවිද භාවයෙන් යුතු සේවා ලබා දීමේ සංස්කෘතියක් පවත්වා ගෙන යාම.
- අවසන් ඉලක්කය දක්වා ගමන් කල හැකි කණ්ඩායම් හැඟීමෙන් යුතු කැපවුණු කාර්යය මණ්ඩලයක් සිටීම.
- සුරක්ෂිත අනාගතයක් සඳහා දරු පරපුරට නිසි මග පෙන්වීම අරමුණු කරගත් නීති විරෝධී මද්‍යසාර, මත්ද්‍රව්‍ය තුරන් කිරීමට කටයුතු කිරීම.
- මනුෂ්‍ය වටිනාකම් අගය කරනු ලබන පුද්ගලයෙකු සමාජ ගත කිරීම.
- විධිමත් උපාය මාර්ගික සැලස්මක් තුළ කටයුතු කිරීම.
- නව තාක්ෂණ ක්‍රමවේද තුළින් සේවාලාභීන්ට කාර්යක්ෂම හා උපරිම සේවාවක් ලබා දීම.
- නවීන තාක්ෂණය මගින් නිවැරදි බදු එකතු කිරීම.
- මනා විශ්වාසයකින් යුත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් භාවිතය අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- බාහිර ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.

1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.4 සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම



පරිච්ඡේදය - 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

2.1.1 ආදායම්

2.1.2 පාලන

2.1.3 තොරතුරු තාක්ෂණ

2.1.4 නීති ක්‍රියාත්මක කිරීම්

2.1.5 යෙදවුම්

2.1.6 අධ්‍යයන හා පර්යේෂණ

2.2 ඉදිරි ඉලක්ක සහ අභියෝග

2.2.1 ඉදිරි ඉලක්ක

2.2.2 අභියෝග

2.3 සුභසාධනය

2.1 විශේෂ ජයග්‍රහණ

2 : 1 : 1 ආදායම්

2022 වර්ෂය සමස්ත ශ්‍රී ලංකාවටම අභියෝගාත්මක වසරක් විය. ඊට ප්‍රධානතම හේතූන් වූයේ 2022 වර්ෂයේ පැවති ඉන්ධන හිඟය, විදුලිය කැපීම, ආර්ථික අර්බුදය කොවිඩ් වසංගත තත්ත්වය හා රටෙහි පැවති දේශපාලනික අස්ථාවරභාවය නිසා ජන ජීවිතයට සිදු වූ බලපෑමයි.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2022 වසර ආරම්භයේදී මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව සුරාබදු හා දුම්කොළ බදු ආදායම රුපියල් බිලියන 185ක් එකතු කිරීම සඳහා එකඟ වූ නමුදු 2022 දෙසැම්බර් මස 31 වන විට එකතු කළ සමස්ත ආදායම (බදු අවකරණය රු.බි. 5.1 සහිතව) රුපියල් බිලියන 170.3 විය. මෙම ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 20.2 %ක ඉහළ යාමකි. දුම්කොළ බදු ආදායම 2021 ට සාපේක්ෂව 9.7%ක වර්ධනයක් පෙන්වන ලදී. ඉන්ධන, විදුලිය, ආර්ථික දේශපාලනික හා සෞඛ්‍ය වැනි අර්බුදයන් හේතුවෙන් මත්පැන් නිෂ්පාදනාගාර සහ මත්පැන් සිල්ලරට විකුණන ස්ථාන වසා තිබියදී මෙන්ම රටෙහි පවතින උද්ධමනකාරී තත්ත්වය මත මත්පැන් සඳහා ඉල්ලුම අඩුවීම යන බාධක හමුවේ මෙවන් ආදායමක් ලබා ගැනීම සුවිශේෂ ජයග්‍රහණයක් වූ අතර, 1912 – 2022 වසර කාලය තුළ ලබා ගත් ඉහළම ආදායම් වාර්තාවද මෙය වේ. ඉහත සඳහන් කල අර්බුදයන් සහ නිරෝධායන නීති රීති අනුව නිෂ්පාදනාගාර, මත්පැන්හල් වසා දැමීම, සංචාරක කර්මාන්තය අඩපණ වීම යන හේතු මත අපේක්ෂිත සුරාබදු ආදායම ලබා ගැනීමට බාධා ඇති විය.



- එසේම මත්පැන්, මෘදු මත්පැන් අපනයනය කිරීම මත රුපියල් බිලියන 5.1 ක සුරාබද්ද ආපසු ගෙවීමෙන් පසුව රුපියල් බිලියන 165.2 ක් මුදලක් මහාභාණ්ඩාගාරය වෙත යැවීමට හැකි වීම සුවිශේෂී කරුණකි.

- සුරාබදු නිවේදන 04/2019 අනුව ආනයනික විදේශ මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකරය ඇලවීම 2019.07.15 දින ආරම්භ කරනු ලැබූ අතර ආරක්ෂිත ස්ටිකරය ඇලවීම සම්බන්ධව සියලු රීති සහ කරුණු මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත්කොට ඇත. සුරාබදු නිවේදන 06/2019, 01/2020, 03/2020, හා 01/2021 මගින් දේශීයව නිෂ්පාදිත මත්පැන් බෝතල් මත ආරක්ෂිත ස්ටිකරය ඇලවීම ආරම්භ කරන දිනය විටින් විට සංශෝධනය කරමින් සහ සුරාබදු නිවේදන 04/2019 පරිවිඡින්න කරමින් සුරාබදු නිවේදන 07/2021 ප්‍රකාශයට පත් කර ඇත. සුරාබදු නිවේදන 07/2021, 08/2021, 09/2021 මගින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන සියලුම මත්පැන් බෝතල් මත ආරක්ෂිත ස්ටිකරය ඇලවීම ආරම්භ කරන ලද දිනය විටින් විට සංශෝධනය වී ඇති අතර එම නිවේදන පරිවිඡින්න කරමින් දේශීයව නිෂ්පාදිත මත්පැන් බෝතල් මත ආරක්ෂිත ස්ටිකරය සහ ඩිජිටල් සළකුණ යෙදීම ආරම්භ කරන දිනය ලෙස 2022 වර්ෂයේ ජනවාරි 3 දින ලෙස ප්‍රකාශයට පත් කරමින් 10/2021 සුරාබදු නිවේදනය ප්‍රකාශයට පත් කර ඇත. මේ වන විට සුරාබදු නිවේදන 07/2021 රීති ප්‍රකාරව දේශීයව නිෂ්පාදිත මත්පැන් හා ආනයනික විදේශ මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකරය සහ ඩිජිටල් සලකුණ යෙදීම සිදු කරනු ලැබේ.

- රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේ අරමුණින් 2022 වර්ෂයේ අයවැය යෝජනා මගින් බීඩි නිෂ්පාදනයේදී බීඩි සඳහා බීඩි දුම්කොළ බද්දක් පැනවීම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ආදායම වැඩි කර ගැනීමට හැකිවීම මත ලබාගත් විශේෂ ජයග්‍රහණයකි. මෙම බදු එකතු කිරීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම 2022.12.31 දින 1999

අංක 08 දරණ දුම්කොළ පනත යටතේ සුරාබදු නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

- සමස්ත ශ්‍රී ලංකාව පුරා නීති විරෝධී මද්‍යසාර, දුම්වැටි සහ මත්ද්‍රව්‍ය පිළිබඳ වැටලීම් 35,381 සිදු කිරීමට නීති ක්‍රියාත්මක කිරීම් අංශය සමත් විය. එම ග්‍රහණවලට අදාළව පවරන ලද නඩු සඳහා රුපියල් 129,497,021.50 ක් දඩ මුදල් පනවනු ලැබිණි. මීට අමතරව බලපත්‍ර කොන්දේසි කඩ කිරීමට එරෙහිව කාර්මික අපරාධ වාර්තා 4,155 ක් ඉදිරිපත් කර රුපියල් 164,831,863ක සමථ මුදලක් රජයට ලබා දීමට හැකි වීම විශේෂ ජයග්‍රහණයකි.

2: 1 : 2 පාලන

- 2022 වර්ෂය තුල පාලන අංශය මගින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට කටයුතු කරන ලදී. ජ්‍යෙෂ්ඨ මට්ටමේ උසස්වීම් ලෙස සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 01ක් හා සුරාබදු අධිකාරී තනතුරු 11ක් ද, ද්විතියික මට්ටමේ උසස්වීම් ලෙස සුරාබදු සැරයන් මේජර් තනතුරු 33ක් හා සුරාබදු සැරයන් තනතුරු 01ක් සඳහා ද උසස්වීම් ලබාදීමට කටයුතු කරන ලදී.

- මීට අමතරව කාලයක් ප්‍රමාදව පැවති නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක 770ක් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක 184ක් ද ලබා දීමට කටයුතු සිදු කරන ලද අතර සහකාර සුරාබදු කොමසාරිස්, ප්‍රධාන සුරාබදු පරීක්ෂක, සුරාබදු පරීක්ෂක, සුරාබදු සැරයන් මේජර්, සුරාබදු සැරයන්/ සුරාබදු නියාමක හා සුරාබදු නියාමක රියදුරු යන තනතුරු සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග ද සාර්ථකව පවත්වන ලදී. 2022 වර්ෂයේ දී නවක සුරාබදු පරීක්ෂක තනතුරු 38 ක් සඳහා නව නිලධාරීන් බඳවා ගන්නා ලදී.

2 : 1 : 3 තොරතුරු තාක්ෂණ

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය දත්ත මාර්ගගත ක්‍රමයට අතුරු මුහුණත් මඟින් ලබා දීමට කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ Asycuda පද්ධතිය හරහා සුරාබදු හා සම්බන්ධිත ආනයන හා අපනයන කටයුතු සඳහා මාර්ගගත (Online) ක්‍රමයට පහසුකම් සැකසීම හා දත්ත හුවමාරු කර ගැනීමට හැකිවීම මෙන්ම ඊට අදාල නිලධාරීන්ට ඊට අදාල පුහුණුව හා තොරතුරු තාක්ෂණ පහසුකම සැපයීම

- 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද ආරක්ෂිත ස්ථිකර් ව්‍යාපෘතියට අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් SLT ආයතනයෙන් ලබා ගැනීම හා ඒ සඳහා MSP (Madrass Security Printers) ආයතනය, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, SLT ආයතනය සම්බන්ධ ත්‍රෛයි පාර්ශික ගිවිසුමකට එළඹීම හා එම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකි වීම

- රජයේ ගිණුම් කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරීම පරිගණකගත ක්‍රමයක්(Digital) මගින් සිදුකිරීමට හදුනාගෙන ඇති ආදායම් කළමනාකරණ පද්ධතිය (Revenue Administration System For Excise Department – RASED සඳහා System Requrement Specitication – SRS පළමු කෙටුම් පත සකස් කිරීම.

- අධිවේගී අන්තර්ජාල පහසුකම් වැඩි දියුණු කිරීම හා ප්‍රාදේශීය කාර්යාල වෙත පරිගණක හා පරිගණක උපාංග ලබා දීමට කටයුතු කිරීම

2:1:4 නීති ක්‍රියාත්මක කිරීම (අපරාධ)



- 2022 වර්ෂය තුලදී දිවයින පුරා පිහිටි සුරාබදු බලපත්‍රලත් ස්ථාන පූර්ණ අධීක්ෂණය හා පරිපාලනය තුළින් ඒ හා සම්බන්ධ බලපත්‍ර කොන්දේසි කඩකිරීම සම්බන්ධ කාර්මික අපරාධ වාර්තා 4,155 ක් ඉදිරිපත් කිරීමෙන් රජයට සමථ මුදල් ලෙස රුපියල් 164,831,863 ක් ලබා දීමට හැකි වීම

- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වැටලීම් 35,381ක් මත නඩු පවරා රුපියල් 129,497,021.50ක දඩ මුදල් ප්‍රමාණයක් උපයා ගැනීමට හැකි වීම

- මහජනතාව හා සමීපව සම්බන්ධ වීම සඳහා සහ මහජන පැමිණිලිවලට ප්‍රමුඛතාවයක් ලබා දීම සඳහා විශේෂ දුරකථන අංකය වන 1913 පැය 24 පුරා ක්‍රියාත්මක කිරීම තුළින් පැමිණිලි 1,552 ලැබුණු අතර, එම පැමිණිලි සුරාබදු පළාත් කාර්යාල වෙත ක්ෂණිකව යොමු කර ඇත.

- නීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා සහ නිලධාරීන්ගේ ආරක්ෂාව උදෙසා මිමී 9 පිස්තෝල 140ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය සමග එක්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කල අතර 2023 වර්ෂයේදී මෙම ගිණි අවි ප්‍රමාණය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මිලදී ගැනීමට නියමිත වේ. මේ මගින් නීතිය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන්ට ආත්ම ආරක්ෂාව හා ක්ෂේත්‍රයේදී ඉහළ මට්ටමේ වැටලීම් සිදු කිරීමට අවකාශය ලැබෙනු ඇත.

2:1:5 යෙදවුම්

- සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අරමුණක් වන දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන සියලුම මත්පැන්, ආනයනික මත්පැන්, මධ්‍යසාර ආසවන මූල ද්‍රව්‍ය ආදියෙහි ප්‍රමිතීන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට සහ ගුණාත්මක නිෂ්පාදන වෙළඳපොළ වෙත යොමු කිරීමට මධ්‍යම රසායනාගාරයක් පවත්වාගෙන යාම ප්‍රධාන අවශ්‍යතාවයක්ව පවතී. ඒ අනුව, පූගොඩ සුරාබදු ස්ථානයට අනුබද්ධව දෙපාර්තමේන්තුවට අයත් නවීන ගොඩනැගිල්ලක මෙම මධ්‍යම රසායනාගාරය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එහි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන මුදලක් 2022 අයවැය මගින් අනුමත වී ඇත.

- 2022.01.01 දින වන විට සුරාබදු දෙපාර්තමේන්තුව සතු සින්නක්කර ඉඩම් ගණන 28 ක් වූ අතර ඉඩම් 17ක අයිතිය පවරා ගැනීමට තිබුණි. ඒ අනුව මේ වන විට ඉඩම් 17න් ඉඩම් 3ක් පවරා ගෙන ඇති අතර තවත් ඉඩම් 14ක් පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතී.

2:1:6 අධ්‍යයන හා පර්යේෂණ

- ශ්‍රී ලංකාව තුළ මහ රා සඳහා නිශ්චිත ප්‍රමිතියක් සකස්කර නොතිබීම නිසා කෘතිම රා නිෂ්පාදනය කිරීම පාලනය කිරීමට බාධා මතුවිණ. ඒ අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අධ්‍යයන හා පර්යේෂණ අංශය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය හා රජයේ රස පරීක්ෂක කාර්යාලය ද, බාහිරව කාර්මික තාක්ෂණ ආයතනය ද එක්ව පොල්, තල්, කිතුල් රා සඳහා ප්‍රමිතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. පසුගිය වර්ෂය තුළ පැන නැගුණු ආර්ථික හා දේශපාලනික අර්බුද හේතුවෙන් එම කටයුතු සඳහා යම් තරමකට බාධා පැමිණියද මේ වන විට එහි යහපත් ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර තවදුරටත් පර්යේෂණ කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී.

- මීට අමතරව දේශීයව නිපදවන අරක්කු සහ බියර් සඳහා ද දේශීයව නිෂ්පාදනය කරනු ලබන විදේශ මත්පැන් සඳහා ද මේ වන විට ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇති අතර වයින් සහ සකේ සඳහාද ප්‍රමිතීන් සකස් කිරීමට කටයුතු කරමින් සිටී. සැර මත්පැන් බීර සහ සකේ බෝතල් ගත කරන නිෂ්පාදනාගාර 26 ක්,ස්කාගාර 14 ක්ද, ගුදම් 15 ක් ද මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතී. සුරාබදු ප්‍රාදේශිය කාර්යාල 56 මගින් ඉහත නිෂ්පාදනාගාරයකින් නිපදවන මත්පැන් වෙළඳපොලට නිකුත් කළ පසුව එහි ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු වේ. සෑම ස්ථානයකටම හයිඩ්‍රෝමීටර් කට්ටල එක බැගින්වත් ලබාදීම අත්‍යාවශ්‍යව පවතී. ඒ අනුව දිවයින පුරා පවතින සියලුම මත්පැන්

නිෂ්පාදනාගාර සඳහා අවශ්‍ය සැර බලන උපකරණ (Hydrometers) කට්ටල 54 මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 138ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මේ වන විට මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කිරීමට හැකි වීම විශේෂ ජයග්‍රහණයකි.

2:2 ඉදිරි ඉලක්ක සහ අභියෝග

2 : 2 : 1 ඉදිරි ඉලක්ක

- 2022 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ලබා දුන් මත්පැන් හා දුම්කොළ සඳහා වූ සංශෝධිත ඉලක්කය බදු ආදායම රුපියල් බිලියන 185 ක් වූ අතර, එය ඉදිරි 2023 වර්ෂය සඳහා රුපියල් බිලියන 217 ක ආදායම් ඉලක්කයක් ලඟා කර ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. බීඩි නිෂ්පාදනය මත පනවන ලද නව බදු ප්‍රතිපත්තිය අනුව 2023 වර්ෂයේ දී බීඩි සඳහා රුපියල් බිලියන 3ක බදු ආදායමක් ලබා ගැනීමට අපේක්ෂිතය.

- 2023 වර්ෂය සඳහා නව සුරාබදු බලපත්‍ර ලබා දීම සහ සංචාරක මණ්ඩලය අනුමත හෝටල් සඳහා මෘදු මත්පැන් බලපත්‍ර ලබා දීම

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 23ක් කුලී පදනම මත සිය මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබමින් පවතින අතර ඒ අතරින් කොළඹ පිහිටි මත්ද්‍රව්‍ය නාශක අංශය මෙන්ම දීපව්‍යාප්ත විශේෂ මෙහෙයුම් ඒකකයද දැඩි ඉඩකඩ සීමාකම් යටතේ පවත්වාගෙන යනු ලබයි. එබැවින් කුලී පදනම යටතේ පවතින කාර්යාල සඳහා ස්ථිර සුරාබදු ස්ථාන ඉදිකර ගැනීම ප්‍රමුඛ ඉලක්කයක්ව පවතී.

- පූගොඩ සුරාබදු ස්ථානයට අනුබද්ධව දෙපාර්තමේන්තුවට අයත් නවීන ගොඩනැගිල්ලක මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එහි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන මුදලක් 2022 අයවැය මගින් අනුමත වී ඇත. ඒ අනුව රසායනාගාරයෙහි මූලික වැඩ කටයුතු එනම් එහි කොටස් වෙන් කිරීම(Partition), රසායනාගාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සහ ගෘහ උපකරණ මිල දී ගැනීම 2023 වර්ෂයේ අවසන් කිරීමට බලාපොරොත්තු වේ. මෙම මධ්‍යම රසායනාගාරය ඉදිකිරීම මගින් දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ශක්තිමත් කරමින් අපගේ කීර්ති නාමය ඉහළ නංවනු ඇත.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය භාර්ය සලකා බැලීමේදී නිලධාරීන් අන්තරායකර ඖෂධ හා නීති විරෝධී මත්පැන් වැටලීම් සඳහා කටයුතු කිරීමේදී නිරන්තර රාජකාරී බාධා කිරීම් සහ අනතුරුවලට ලක් වූ අවස්ථා වාර්තා වේ.එබැවින් දෙපාර්තමේන්තුවට සන්නිවේදන උපකරණ හා ජංගම සන්නිවේදන උපකරණ ලබා ගැනීම අත්‍යාවශ්‍යව පවතී.

- RASED පද්ධතියේ සියලු අවශ්‍යතා හඳුනාගෙන එම මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කර ගැනීම සඳහා සේවාදායකයෙකු හඳුනාගැනීම සහ එහි සංවර්ධන කටයුතු මොඩියුල් ආකාරයෙන් සිදු කිරීමටත් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීමටත් බලාපොරොත්තු වේ.

- කාර්යක්ෂම සේවාවක් සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිල ඇදුම් කාර්ය මණ්ඩලයට නව සේවා ව්‍යවස්ථාවක් හඳුන්වා දීම අත්‍යාවශ්‍ය අතර, එය අවසන් අදියරේ පවතී.

2 : 2 :2 අභියෝග

- 2023 වර්ෂය සඳහා රුපියල් බිලියන 217 ක ආදායම් ඉලක්කය වෙත ලඟා වීම මත්පැන් නිෂ්පාදන මිල ඉහළ යාම, ස්ප්‍රිතු නිෂ්පාදන වියදම ඉහළ යාම, රටෙහි පවතින උද්ධමනය, ක්‍රය ශක්තිය අඩුවීම වැනි හේතු මත විශාල අභියෝගයකි. එමෙන්ම බීඩි ඒකක එකක් සඳහා පනවන ලද රුපියල් දෙකක(2/=) නව බද්ද ක්‍රියාත්මක කිරීම මගින් 2023 වර්ෂය සඳහා රුපියල් බිලියන 3ක ආදායම ලබා ගැනීම ද අභියෝගයකි.

- දේශීයව නිෂ්පාදනය කරන සියලුම මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකරයක් (Fool Proof Sticker) හෝ ආරක්ෂිත සලකුණ (Digital Marking) යෙදීම 2022 වර්ෂයේ ජනවාරි මස සිට ආරම්භ කරන ලදී. මෙම නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භයේ දී පැන නැගුණු විවිධ ගැටළු නිරාකරණය කර ගනිමින් 2022 වර්ෂයේ අප්‍රේල් මස සිට සියලුම නිෂ්පාදනාගාර නියමිත පරිදි ස්ටිකරය යෙදීම ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය නියාමනය කරමින් නිවැරදිව නොකඩවා පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවට විශාල අභියෝගයකි.

- සමස්ත දෙපාර්තමේන්තුවේ රාජකාරී කරනු ලබන නිල ඇදුම් කාර්ය මණ්ඩලය, සෑම තරාතිරමකම නිලධාරීන් පසුගිය වර්ෂ වලදී උසස්වීම්වලට හිමිකම් කීම හේතුකොට ගෙන ද්විතීය මට්ටමේ දැඩි නිලධාරී හිඟයක් මතු වී ඇත. විශේෂයෙන්ම සුරාබදු නියාමක, නියාමිකා තනතුරු 114ක පමණ හිඟයක් පවතී. ඒ සඳහා නව බඳවාගැනීම් සිදුකළ යුතු වුවත් නව බඳවා ගැනීම් අත්හිටුවීමේ රජයේ තීරණය මත දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පවත්වා ගෙන යාම අභියෝගයකි.

- මත්පැන් නිෂ්පාදනයේදී භාවිතයට ගන්නා හිස් බෝතල් හා හිස් බියර් ටින් (බියර් කෑන්) නිසිලෙස එකතු කිරීම හා ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම පිළිබඳ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමු කර මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය හා ඊට අදාළ බාහිර ආයතන සමග සාකච්ඡා කර මත්පැන් අලෙවිසැල් ආසන්නයේ යකඩ යොදා සකසන ලද කූඩා සවි කිරීම සිදු කරන ලදී. මෙහිදී එකතු වන හිස් බියර් ටින් ප්‍රතිචක්‍රීකරණය කිරීම ද මේ වන විට ආරම්භ කර ඇති බැවින් ඉදිරියේදී බියර් කෑන් පරිසරයට එක් වීමේ අවදානමක් ද නොපවතී.
- සුරාබදු ආදායම වැඩි කර ගනු වස් මත්පැන් විකිණීමේ සිල්ලර වෙළඳසැල් බලපත්‍ර (ර.බී.04) අලුතින් නිකුත් කිරීම පිළිබඳ ආගමික, සමාජීය හා දේශපාලනික ප්‍රතිරෝධය සමස්ත කාර්ය සාධනයට අභියෝගයකි.
- යෙදවුම් අංශය සඳහා වාහන මිලදී ගැනීමට ඇති බාධාවන් සහ වාහන අලුත්වැඩියාව සඳහා අමතර කොටස් වෙළඳපොළේ ඇති හිඟය දෙපාර්තමේන්තුවේ ඇති වාහන පරිපාලනය සඳහා දැඩි බලපෑමක් සිදු කර ඇත. එමෙන්ම නවක රියදුරන් බඳවා ගැනීමේ අවශ්‍යතාව ද විශාල ලෙස පවතී.

2:3 සුභසාධනය

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සුභසාධන සංගමයක් පිහිටුවීම තුළින් අංග සම්පූර්ණ ආපන ශාලාවක් හා සේවක සුභසාධනය කාර්යක්ෂම කිරීමට බලාපොරොත්තු වේ.

- රාජ්‍ය ආදායම වර්ධනය සඳහා කැපවන සුරාබදු දෙපාර්තමේන්තුවේ රාජකාරී කරන සියලුම කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය සඳහා දිරි දීමනාවක් ලබා දීමට මුදල් අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

පරිච්ඡේදය - 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය- සුරාබදු තෑගි අරමුදල

3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

3.7 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.9 මු.රෙ.**208** ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව **2022** වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

ඒසිඒ-එස්

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		**165,227,025,349.00**	**138,674,173,166.00**	
-	ආදායම් බදු	**1**	-	-	
185,036,000,000.00	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	165,227,025,349.00	138,674,173,166.00	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
185,036,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**		**165,227,025,349.00**	**138,674,173,166.00**	
-	**ආදායම් නොවන ලැබීම්**		**636,428,953.00**	**886,428,296.00**	
-	භාණ්ඩාගාර අග්‍රිම		380,000,000.00	679,573,363.00	**ඒසිඒ-3**
-	තැන්පතු		207,733,044.00	157,522,980.00	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		48,695,909.00	49,331,953.00	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**636,428,953.00**	**886,428,296.00**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**165,863,454,302.00**	**139,560,601,462.00**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		163,894,015,184.00	138,142,330,124.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,969,439,118.00	1,418,271,338.00	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		**1,770,977,060.00**	**1,244,517,930.00**	
1,081,300,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,048,170,199.00	976,986,009.00	
737,250,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	716,982,651.00	260,405,523.00	ඒසිඒ-2(ii)
6,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	5,824,210.00	7,126,398.00	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,824,550,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,770,977,060.00**	**1,244,517,930.00**	
	මූලධන වියදම්		**68,247,037.00**	**114,949,465.00**	
51,500,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	24,362,844.00	30,960,540.00	
143,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	41,421,817.00	74,742,255.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	**13**	-	-	
2,500,000.00	හැකියා වර්ධනය	**14**	2,462,376.00	9,246,670.00	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
197,000,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**68,247,037.00**	**114,949,465.00**	
	තැන්පතු ගෙවීම්		188,973,432.00	212,750,718.00	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		42,959,371.00	40,135,614.00	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		231,932,803.00	252,886,332.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**2,071,156,900.00**	**1,612,353,727.00**	
2,021,550,000.00	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(101,717,782.00)**	**(194,082,389.00)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(102,108,741.00)	(195,860,768.00)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		390,959.00	1,778,379.00	**ඒසිඒ-3**
			(101,717,782.00)	**(194,082,389.00)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (2022 දෙසැම්බර් 31 දිනට)

ඒසීඒ-පී

	සටහන	තත්‍ය	
		2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,755,263,088.00	1,681,654,585.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5	155,562,043.00	161,298,581.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	390,959.00	1,778,379.00
මුළු වත්කම්		**1,911,216,090.00**	**1,844,731,545.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(169,409,568.00)	(144,913,418.00)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,755,263,088.00	1,681,654,585.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(ඩී)		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසීඒ-4	324,971,611.00	306,211,999.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	390,959.00	1,778,379.00
මුළු වගකීම්		**1,911,216,090.00**	**1,844,731,545.00**

පිටු අංක 6 සිට 37 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 38 සිට 57 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :කේ.එම්.මහින්ද සිරිවර්ධන	නම :ජේ.එම්.එස්.එන්.ජයසිංහ	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :ලේකම්	තනතුර :සුරාබදු කොමසාරිස් ජනරාල්	නම :පී.අපිතා චාන්දනී
දිනය : 28/12/2023	දිනය : 01/02/23	දිනය : 2023/2/23

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

පී. අපිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒසී-

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2022 **රු.**	**2021** **රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	165,227,025,349.00	138,674,173,166.00
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,778,379.00	25,273,362.00
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	91,125,084.00	101,811,040.00
අග්‍රිම ලැබීම්	380,000,000.00	679,573,363.00
අත්තිකාරම් අයකර ගැනීම්	42,573,817.00	43,579,534.00
තැන්පතු ලැබීම්	207,733,044.00	157,522,980.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**165,950,235,673.00**	**139,681,933,445.00**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,765,793,859.00	1,243,628,244.00
සහනාධාර සහ මාරුකිරීම්	5,824,210.00	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,091,048.00	6,635,771.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	163,894,015,184.00	138,142,330,124.00
අත්තිකාරම් ගෙවීම්	37,448,523.00	29,788,634.00
තැන්පතු ගෙවීම්	188,973,432.00	212,750,718.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**165,894,146,256.00**	**139,635,133,491.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**56,089,417.00**	**46,799,954.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	19,794,100.00
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**19,794,100.00**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	55,698,458.00	64,815,675.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**55,698,458.00**	**64,815,675.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(55,698,458.00)**	**(45,021,575.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**390,959.00**	**1,778,379.00**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0.00**	**0.00**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**390,959.00**	**1,778,379.00**

3.4 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු තෑගි අරමුදල
2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
(රුපියල් වලින්)

	2022	2021
අයභාරය		
සමථ ගාස්තු ලැබීම්	154,560,181	115,792,101
සිගරට් දඩ	4,986,600	5,318,748
මුළු අයභාරය	**159,546,781**	**121,110,848**
වියදම්		
තෑගි මුදල් ගෙවීම	79,724,620	156,433,104
රජයේ ආදායමට ගෙවීම - සමථ ආදායම 15%	23,184,027	17,443,815
රජයේ ආදායමට ගෙවීම - සිගරට් දඩ 75%	3,739,950	4,132,386
දුම්කොළ අරමුදලට වෙන් කිරීම	1,077,275	1,329,687
විශේෂ වැටලීම්		-
වෙනත්	99,890	249,000
ක්ෂයවීම් (උපලේඛන 01)	3,276,488	9,359,640
බලපත්‍රලාභීන්ට නැවත ගෙවීම	-	3,826,000
මුළු වියදම්	**111,102,250**	**192,773,632**
අතිරික්තය / (ඌනතාවය)	**48,444,530**	**(71,662,784)**

සකස් කළේ:-

පරික්ෂා කළේ:-

ආර්. එම්. වජිරා නයෝමිණි
ගණකාධිකාරී (ආදායම්)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො: 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

ජී.අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී

පී. අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු නැගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු නැගි අරමුදල
2022 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ඒකකය රුපියල්	2022	2021
වත්කම්		
ජංගම වත්කම්		
සමථ ලැබීම් සහ ගෙවීම් ගිණුම	192,517,335	142,637,736
ලැබිය යුතු සමථ ගාස්තු	9,651,195	19,922,877
ලැබිය යුතු සිගරට් දඩ	960,400	282,900
	203,128,930	**162,843,513**
ජංගම නොවන වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි (උපලේඛන 02)	47,134,000	47,134,000
වාහන (උපලේඛන 03)	808,481	1,077,975
ලී බඩු සහ උපකරණ (උපලේඛන 04)	904,357	860,599
විද්‍යුත් උපකරණ (උපලේඛන 05)	9,918	12,397
කාර්යාල උපකරණ (උපලේඛන 06)	11,131,732	13,917,665
ක්‍රීඩා භාණ්ඩ (උපලේඛන 07)	3,142	3,928
පුස්තකාල පොත් (උපලේඛන 08)	20,366	25,458
වෙනත් උපකරණ (උපලේඛන 09)	3,882	4,437
ක්ෂය වත්කම් මිලට ගැනීම	49,687,107	258,908
ක්ෂය සංචිත අරමුදල	18,974,695	65,385,316
	128,677,682	**128,680,683**
මුළු වත්කම්	**331,806,612**	**291,524,196**
බැරකම්		
කෙටිකාලීන බැරකම්		
රජයේ ආදායමට ගෙවිය යුතු සමථ මුදල්	1,447,679	2,988,432
රජයේ ආදායමට ගෙවිය යුතු සිගරට් දඩ මුදල්	720,300	212,175
දුම්කොළ අරමුදලට ගෙවිය යුතු මුදල්	240,100	70,725
ගෙවිය යුතු නැගි මුදල්	7,238,396	15,136,472
දිගුකාලීන බැරකම්		
දුම්කොළ අරමුදලට ගෙවිය යුතු අරමුදල්	21,440,516	20,437,066
ශුද්ධ වත්කම්	**300,719,620**	**252,679,326**
ශුද්ධ වත්කම් /ස්කන්ධය		
සමුච්චිත අරමුදල	252,775,090	324,342,110
පෙර වර්ෂයේ ගැලපීම්	(500,000)	
අතිරික්කය / (ඌනතාවය)	48,444,530	(71,662,784)
මුළු ස්කන්ධය	**300,719,620**	**252,679,326**

සකස් කළේ:-

පරීක්ෂා කළේ:- - අර් ඇම්.ඩබ්ලිව්. නෙත්තිනී - ගිණුම්කාරිය (අතුරුදන්)

පිටු අංක 07 සිට 08 දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 18 සිට 44 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ සමස්ථයක කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීම හා ඉදිරිපත් කිරීමේ වගකීම පරිපාලන කාරක සභාව සතුය. ඒ අනුව 2022 වර්ෂයට අදාළව පිළියෙල කළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශණ පරිපාලන කාරක සභාව අනුමත කරමු .

රෝහණ සේනාරත්න
සුරාබදු කොමසාරිස් (පාලන)

රෝහණ සේනාරත්න
සුරාබදු කොමසාරිස් (පාලන හා මානව සම්පත්)
ශ්‍රීලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353,කෝට්ටේ පාර,
රාජගිරිය.

පී.එච්.සී.සිල්වා
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම)

පී.එච්.සී. සිල්වා
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම)

ජේ.එම්.එස්.එන්.ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු තෑගි අරමුදල
2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(රුපියල් වලින්)

	2022	2021
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ලැබීම්		
සමථ ගාස්තු ලැබීම්	164,831,863	113,782,048
සිගරැට් දඩ මුදල් ලැබීම්	4,309,100	5,509,848
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුළු ලැබීම්	**169,140,963**	**119,291,896**
ගෙවීම්		
සමථ තෑගි මුදල්	87,428,382	144,710,346
රජයේ ආදායමට	27,956,604	21,274,479
විශේෂ වැටලීම් සඳහා	-	-
ක්ෂය සංචිත අරමුදලට (උපලේඛන 01)	3,276,488	9,359,640
බලපත්‍රලාභීන්ට නැවත ගෙවීම	-	3,826,000
වෙනත්	599,890	249,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුළු ගෙවීම්	**119,261,364**	**179,419,466**
ශුද්ධ මුදල් ප්‍රවාහය	**49,879,599**	**(60,127,570)**
ආයෝජන ක්‍රියාකාරක වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		-
මුදල්වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	49,879,599	(60,127,570)
කාල පරිච්ඡේදය ආරම්භයේ වූ මුදල්	142,637,736	202,765,840
2022.12.31 දිනට මුදල් ශේෂය	**192,517,335**	**142,637,736**

සකස් කළේ:-

පරීක්ෂා කළේ:-

ආර්. එම්. වජිරා නයෝමිණී
ගණකාධිකාරී (ආදායම්)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො: 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

ජී.අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී

පි. අජිතා චාන්දනි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

3.7 මූල්‍ය ප්‍රකාශ සටහන්

ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම්	ආදායම්	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
කේතය	කේතය	මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන
	විස්තරය	(රු.)	(රු.)	(රු.)	ආදායම්
					ඇස්තමේන්තුව
					% ලෙස
1002.04.01	මත්පැන්	185,000,000,000.00	185,000,000,000.00	165,187,536,555.00	89.29
1002.06.00	දුම්කොළ බද්ද	36,000,000.00	36,000,000.00	39,488,794.00	109.69
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලිය	700,000.00	170,000.00	393,870.00	231.69
2002.02.99	පොලි වෙනත්	6,500,000.00	6,300,000.00	6,322,110.00	100.35
2003.01.00	දෙපාර්තමේන්තුමය විකිණීම්	1,000,000.00	4,000,000.00	8,008,575.00	200.21
2003.02.99	විවිධ	35,000,000.00	18,000,000.00	38,208,482.00	212.27
2004.01.00	සමාජ සංරක්ෂණ දායක මුදල් මධ්‍යම රජය	-	-	38,192,047.00	-

3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන	වෙන් කරන ලද ප්‍රතිපාදන			උපයෝගි කරනු ලැබූ
වර්ගය	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන	තක්ෂ වියදම	ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන
	(රු.)	(රු.)	(රු.)	ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%)ලෙස
පුනරාවර්තන	1,824,550,000.00	1,824,550,000.00	1,770,977,060.00	97.06
ප්‍රාග්ධනය	197,000,000.00	197,000,000.00	68,247,037.00	34.64

3.9 මු.රෙ.208 ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් (%) ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01	දිස්ත්‍රික් ලේකම් - අම්පාර	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	133,621.00	133,621.00	105,660.00	79.07
02	දිස්ත්‍රික් ලේකම් - රත්නපුර	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	837,549.97	837,549.97	837,549.97	100
03	දිස්ත්‍රික් ලේකම් - නුවරඑළිය	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	166,565.96	166,565.96	135,723.50	81.48
04	දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	486,735.00	486,735.00	486,735.00	100
05	දිස්ත්‍රික් ලේකම් - රත්නපුර	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	1,884,000.00	1,884,000.00	1,142,783.30	60.66
06	දිස්ත්‍රික් ලේකම් - කොළඹ	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	2,356,590.31	2,356,590.31	2,240,875.21	95.09
07	දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුරය	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	4,258,823.99	4,258,823.99	4,218,457.05	99.05
08	දිස්ත්‍රික් ලේකම් - කළුතර	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	950,000.00	950,000.00	918,419.29	96.68
09	දිස්ත්‍රික් ලේකම් - නුවරඑළිය	ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.	250,000.00	250,000.00	242,500.00	97

3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය (රු.)	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම.
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	448,902,207.71	448,902,207.71		100%
9152	යන්ත්‍රෝපකරණ	692,400,455.10	692,400,455.10		100%
9153	ඉඩම්	257,325,000.00	257,325,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	3,803,200.00	3,803,200.00		100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	174,869,318.24	174,869,318.24		100%
9180	බදු දෙන ලද වත්කම්	177,962,907.00	177,962,907.00		100%

පරිච්ඡේදය - 04

කාර්ය සාධන දර්ශක

4.1 හැඳින්වීම

4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක

4.2.1 පාලන අංශය

4.2.2 ආදායම් අංශය

4.2.3 නීති ක්‍රියාත්මක කිරීම් අංශය

4.2.4 ගිණුම් අංශය

4.2.5 අභ්‍යන්තර විගණන අංශය

4.2.6 මානව සම්පත් අංශය

4.2.7 තොරතුරු තාක්ෂණ අංශය

4.2.8 ප්‍රවාහන හා යෙදවුම් අංශය

4.2.9 අධ්‍යයන හා පර්යේෂණ අංශය

4.2.10 සංඛ්‍යාලේඛන අංශය

4.2.11 සැපයුම්දාම නියාමන අංශය

4.2.12 නීති අංශය

4.1 හැඳින්වීම

2022 වර්ෂයට අදාළව මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ කාර්යසාධන දර්ශක එක් එක් අංශයට අදාලව සකස් කර ඇත. 2022 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට ලබාදුන් ආදායම් ඉලක්කය රුපියල් බිලියන 185 ක් විය. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 165.2ක් ආදායම ලෙස මහා භාණ්ඩාගාරයට ලබා දී ඇති අතර රුපියල් බිලියන 5.1 ක බදු අවකරණය ද සහිතව එකතු කරන ලද ආදායම රුපියල් බිලියන 170.3 ක් විය. ඒ අනුව ආදායම එකතු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස ගත් කල 92% ක ප්‍රතිශතයක් වාර්තා කර ඇත. 2022 වර්ෂයේදී රට මුහුණ දුන් විවිධ අර්බුදයන් මධ්‍යයේ වුවද ලබාගත් මෙම ප්‍රගතිය සතුටට කරුණකි.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය සඳහා දායක වූ දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් පිළිබඳව සලකා බැලීමේදී නීති ක්‍රියාත්මක කිරීමේ අංශය සහ නීති අංශයේ ප්‍රගතිය 100% ඉක්මවූ ප්‍රතිශතයක් ලබා තිබෙන බව සතුටින් සඳහන් කල හැකිය. එමෙන්ම තවත් අංශ 6 ක් ඔවුන්ගේ ප්‍රගතිය 90% - 100% අතර සීමාවේ පවත්වා ගෙන තිබීමද අගය කළ යුත්තකි.

පාලන අංශයේ ප්‍රගතිය පසුගිය වසර හා සමානවම 100% ක කාර්යසාධනයක් පෙන්වන ලද අතර වසර ගණනාවක් ලබා නොදී තිබූ උසස්වීම් සහ නව බඳවා ගැනීම් යම් ප්‍රමාණයක් 2022 වර්ෂය තුළ සිදු කර ඇත. තවදුරටත් විවිධ තනතුරු සඳහා පුරප්පාඩු පැවතුණත් නව බඳවා ගැනීම් නොකිරීමට රජය ගත් තීරණය මත එම පුරප්පාඩු පිරවීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ රටෙහි පැවති ඉන්ධන , විදුලි අර්බුද හා රටෙහි පැවති අස්ථාවර තත්ත්වය වැනි කරුණු මධ්‍යයේ මෙම සාර්ථකත්වය අත්කර ගැනීම සුවිශේෂී කරුණකි.

පෙර සඳහන් කළ පරිදි ආදායම් එකතු කිරීමේදී මුහුණදුන් විවිධ අසිරුතාවයන් මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තු ඉතිහාසයේ වසර 110 කට පසුව ඉහළම ආදායම වූ රුපියල් බිලියන 165.2 ක් මහා භාණ්ඩාගාරයට බැර කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ආදායම් අංශයේ ප්‍රගතිය 92% ක මට්ටමකට ළඟාවීමට හැකිවීම සතුටට කරුණකි. පාලන අංශය, නීති ක්‍රියාත්මක කිරීමේ අංශය, අභ්‍යන්තර විගණන අංශය, මානව සම්පත් අංශය හා නීති අංශය යන අංශයන්ගේ කාර්යසාධනය 100% ක්ම සාර්ථකව ඉෂ්ඨ කර ඇති අතර ආදායම් අංශය, ගිණුම් අංශය, තොරතුරු තාක්ෂණ අංශය, අධ්‍යයන හා පර්යේෂණ අංශයේ අධ්‍යයන කටයුතු හා සැපයුම්දාම නියාමන අංශය තම කාර්යසාධනය 100% මට්ටමට ආසන්නව ඉටු කරන ලදී.

සංඛ්‍යාලේඛන අංශය, තොරතුරු තාක්ෂණ අංශයේ RAMIS පද්ධතිය සම්බන්ධ කටයුතු වල ප්‍රගතිය 75% - 89% මට්ටමේ තබා ගැනීමට සමත් වී ඇත.

2022 වර්ෂයේ නිලධාරී පුහුණු කටයුතු සඳහා මූල්‍යයමය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි නොලැබුණත් ලැබුණු සියලුම ප්‍රතිපාදන සහ වෙනත් ශීර්ෂයන් යටතේ ශේෂව පැවති ප්‍රතිපාදන ද භාවිතා කරමින් රටෙහි පැවති විවිධ අර්බුද තත්ත්වයන් මධ්‍යයේ වුවද නිලධාරී පුහුණු කිරීම් සිදු කිරීම ප්‍රශංසා කල යුතු කරුණකි.

අධ්‍යයන හා පර්යේෂණ අංශය මගින් මහ රා ප්‍රමිතිකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික පර්යේෂණ කටයුතු 2022 වර්ෂයේ ආරම්භ කල අතර මේ වන විට එම කටයුතු සිදු කරගෙන යමින් පවති. එමෙන්ම පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා වන රසායනාගාරයක් පිහිටුවීමට ප්‍රතිපාදන 2022 වර්ෂයේ අයවැය මගින් වෙන්කර ඇති අතර එම කටයුතු සිදු කෙරෙමින් පවති. ඒ අනුව පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය 75%ක පමණ මට්ටමකට ළඟා කර ගැනීමට සමත් වී ඇත.

කෙසේ වුවද ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ අටක ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 90% ට වඩා ඉහළ අගයක් ගැනීම විශේෂත්වයකි. මේ අනුව සලකා බලන කළ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනයේ තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සාර්ථකව ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇත.

4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක (2022 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී අංශ	විශේෂිත දර්ශක		තත්‍ය නිමැවුම, අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස				
			>100%	90 %- 100%	75%- 89 %	50 %-74 %	0% - 50%
4.2.1 පාලන අංශය	පාලන හා පරිපාලන කටයුතු			100%			
4.2.2 ආදායම් අංශය	2022 අපේක්ෂිත ආදායම රැස් කිරීම	මත්පැන්		90%			
		දුම්කොළ	109%				
4.2.3 නීති ක්‍රියාත්මක කිරීම් අංශය	1. අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීම		128%				
	2. සුරාබදු බලපත්‍ර සඳහා කාර්මික අපරාධ වාර්තා		127%				
	3. මත්ද්‍රව්‍ය අපරාධ වාර්තා			100%			
	4. දුම්කොළ ආශ්‍රිත වැටලීම් ඉලක්ක			100%			
4.2.4 ගිණුම් අංශය	2022 වර්ෂයේ සියලුම ගිණුම් කටයුතු			92%			
4.2.5 අභ්‍යන්තර විගණන අංශය	2022 වර්ෂයේ ඉටුකල යුතු අභ්‍යන්තර විගණන වැඩ සටහන			100%			
4.2.6 මානව සම්පත් අංශය	1. සමස්ත නිලධාරී පුහුණුව			100%			
	2. නිලධාරී සංවර්ධනය			100%			
4.2.7 තොරතුරු හා තාක්ෂණ අංශය	වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම			98%			
	නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	1. RAMIS පද්ධතියට අතුරු මුහුණත හරහා දත්ත ලබා දීම			75%		
		2. ASYCUDAපද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට පහසුකම් ලබා දීම		100%			
		3. RASED පද්ධතිය සඳහා උපදේශන සේවාවට අදාළ මූල්‍යමය යෝජනාවලිය මොරටුව විශ්වවිද්‍යාලයෙන් ලබා ගැනීම		100%			
		4. RASED ව්‍යාපෘතියේ SRS පලමු කෙටුම්පත සකස් කිරීම		100%			
		5. Sticker ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සම්බන්ධීකරනය කිරීම හා ඒ සඳහා ගිවිසුම් ගත වීම		100%			
4.2.8 ප්‍රවාහන හා යෙදවුම් අංශය	යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු					55%	
	ප්‍රවාහන හා සෙසු අදාළ රාජකාරී			90%			
4.2.9 අධ්‍යයන හා පර්යේෂණ අංශය	අධ්‍යයන කටයුතු			90%			
	පර්යේෂණ කටයුතු				75%		
4.2.10 සංඛ්‍යාලේඛන අංශය	සංඛ්‍යාලේඛන කටයුතු හා දත්ත නිකුත් කිරීම				85%		
4.2.11 සැපයුම්දාම නියාමන අංශය	ස්ටිකර් ව්‍යාපෘතිය	දේශීය		95%			
		විදේශීය		100%			
4.2.12 නීති අංශය	නීතිමය අවශ්‍යතා		235.88%				
	අපේක්ෂිත නව ප්‍රවණතා						5%

සැ.යු. 2022.03.18 සිට 2022.12.31 දක්වා කාලය තුළදී සමස්ත දිවයිනටම බලපැවති ආර්ථික අර්බුදය, ඉන්ධන අර්බුදය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යසාධන නිමවුමේ ප්‍රතිශතය 100% සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

පරිච්ඡේදය - 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) හඳුනා ගැනීමේ කාර්ය සාධනය

5.1 හැඳින්වීම

5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය

5.1 හැඳින්වීම

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධනය පිළිබඳ පනතේ විධිවිධාන පරිදි ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ කවුන්සිලයේ මග පෙන්වීම මත සෑම රාජ්‍ය ආයතනයක්ම, අධ්‍යාපන ආයතනයක්ම හා සිවිල් සමාජයක්ම 2030 වර්ෂයේදී ඉටුකර ගත යුතු තිරසාර සංවර්ධනය අරමුණු කොට ගෙන තිරසාර සංවර්ධන අරමුණු 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙලකි.ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍ය ආදායම් එකතු කරනු ලබන ප්‍රධාන හා වගකිව යුතු ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හදුන්වා දීමේදී තිරසාර සංවර්ධන අරමුණු 17 න් ප්‍රධාන වශයෙන් අරමුණු 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් අංශ ප්‍රධානීන් සමග සාකච්ඡාකර එකගතාවයකට එළඹිණි. එකී අරමුණු වන්නේ , අරමුණු අංක 01, 03, 12,16 සහ 17 වේ. මේ පිළිබඳව විස්තරාත්මකව පරිච්ඡේද අංක 5.2 හි කරුණු දක්වා ඇත.

ඉහත සඳහන් කරුණු අතුරින් විශේෂිත වූ සෑම තැනම සෑම ආකාරයකින්ම පවතින දිළිදුභාවය තුරන්කිරීම යන අරමුණු අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂයේදී අප විසින් රුපියල් බිලියන 165.2 ක් ආදායම් ලෙස එකතු කරන ලද අතර, එය ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවගේ සංවර්ධනය උදෙසා සහ ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා භාවිත කිරීමට මහා භාණ්ඩාගාරයට බැර කර ඇත.දිළිදු භාවය දුරු කිරීම සඳහා ප්‍රධාන සාධකයන් වන ආර්ථික සංවර්ධනයට සෘජුව බලපාන නීති විරෝධී මද්‍යසාර හා මත්පැන් සමාජයෙන් ඉවත් කිරීම ඉතා වැදගත් වේ. මෙම කාර්යයෙහිලා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විශිෂ්ට දායකත්වයක් ලබා දෙනු ලැබේ. දුම්කොළ භාවිතය ද මිනිස් ශරීරයට හිතකර වන්නක් නොවන බැවින් දුම්කොළ භාවිතය අධෛර්යමත් කිරීමේ අරමුණින් සහ රාජ්‍ය ආදායම ඉහල නංවා ගැනීම තුලින් ජනතාවට අවශ්‍ය සහන සලසා දීමේ අරමුණින් බීඩි සඳහා නව බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරමින් සිටින අතර 2023 වර්ෂයේදී එය ක්‍රියාත්මක කිරීමට නියමිත වේ. වැටලීම් සිදු කිරීමෙන් පමණක් ගැටළුවලට විසඳුමක් නොලැබෙන අතර, ඒ සඳහා ඇති ඉල්ලුම අඩු කිරීමද විශේෂිත වේ.ඒ අනුව දැවැන්ත සමාජ දැනුවත් කිරීමේ ව්‍යාපාර හා ඊට අදාල අනිකුත් සමගාමී ආයතන සමඟ එක්ව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කරනු ලැබේ.

දරිද්‍රතාවයෙන් පෙලෙන හා අවධානමට ලක් වී තිබෙන ජනතාවගේ යහ පැවැත්ම හා සෞඛ්‍ය ආරක්ෂිත බව සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව කැපවීමෙන් කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව මත්පැන් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා බදු මුදල් වැඩි කිරීමෙන් ඒ සඳහා වන මිලදී ගැනීමේ හැකියාව අඩු කිරීමත් ඊට ඇති ඉල්ලුම අඩු කිරීමත් සිදු කරනු ලැබේ. ජනතාව අතර මත්පැන් ලබාගත හැකි සීමාවන් දැඩි කිරීමෙන්ද, නිකුත් කරනු ලබන නීත්‍යානුකූල මත්පැන් නිසි ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කිරීමද, හැකිතාක් දුරට ජනතාවට මත්පැන්වලින් ඉවත්ව සිටීම සඳහා නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන්ද, පරිසරයට සිදුවන හානි අවම කිරීමට අදාළ සමගාමී ආයතන සමඟ එක්ව ක්‍රියා කිරීමද වැදගත් පියවරක් ලෙස පෙන්වා දිය හැක.

මද්‍යසාර නිෂ්පාදනය කරනු ලබන සියලුම නිෂ්පාදකයින් එකී කටයුතු සිදු කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයන් හා නියමයන්ට අනුව කටයුතු කිරීමෙන් ස්වභාවික ජල මූලාශ්‍ර හා පිරිසිදු වාතාශ්‍රය ලබා දීම සඳහා බොයිලේරු ක්‍රියාත්මක කිරීමේදී සහ ජල පිරිසිදු කිරීම් සිදු කිරීමේදී අදාල පළාත් පාලන ආයතනවල නිර්දේශ හා උපදෙස් අනුව කටයුතු කිරීමටද නිෂ්පාදකයින් දිරිමත් කරන ලදී. මීට අමතරව මත්පැන් පරිභෝජනය කිරීමෙන් පසු ඉවත දමන බෝතල් සහ කෑන් ආදිය තැන තැන දමා යාමෙන් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා දිවයින පුරා විසිරී පවතින සේ මත්පැන් අලෙවිසල් අසල කූඩ 1300ක් සවි කිරීම සිදු කර ඇත.

සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ඇතිවන ආකාරයෙන් සහ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින්ට වද හිංසා කිරීම්, කුට්ඨනයට ලක් කිරීම් හා ප්‍රචණ්ඩත්වයට ලක්වීම වැළැක්වීම සඳහා සියලුම නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට නිරන්තර උපදෙස් ලබා දීම සිදු කරනු ලැබේ. රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයකදීම අල්ලස හා දූෂණය කැපී

පෙනෙන ලෙස අඩු කිරීම සඳහා සිදු කරනු ලබන සියලුම රාජකාරී ඵලදායී, වගවීමෙන් යුතු සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම සඳහා කටයුතු කර ඇත. මේ අනුව නිරන්තර නිලධාරී පුහුණුව, අල්ලස් හා දූෂණ වළක්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සමාජ හිංසනයෙන් තොරව රාජකාරී කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීමටද, නිරන්තරයෙන් කටයුතු කරන ලදී.වර්ෂ 2030 වන විට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තුළ තිරසාර සංවර්ධනයේ මූලික අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා කටයුතු කළ හැකි සෑම ආකාරයේ ක්‍රියාකාරකමක්ම නොපිරිහෙලා ඉටු කිරීම සඳහා කටයුතු කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය ඇප කැප වී කටයුතු කරනු ලැබේ.

5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය

- තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එම අරමුණු ඇතුළත් කර සකස් කර ඇත.
- 2022 වර්ෂයේ ඉලක්ක ගත තිරසාර සංවර්ධන අරමුණු සහ ඒ සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -70%	75%-100%
අරමුණ - 01 සෑම තැනම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳුභාවය තුරන් කිරීම.	➢ කාර්යක්ෂමව හා සඵලදායී ලෙස නියමිත බදු එකතු කිරීම තුලින් රටේ සංවර්ධනයට දායක්ත්වය ලබා දීම, ආර්ථික හා සමාජීය සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයට එම බදු මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට නිසි කලට බැර කිරීම.				✓
	➢ නීති විරෝධී මත්පැන් සහ අන්තරායකර ඖෂධ මත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස නිති ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ ආරක්ෂණය වැඩි දියුණු කිරීම හා දුප්පත්කම දුරු කිරීම.				✓
	➢ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම ගම්මාන තෝරා ගෙන මත්පැන් හා අන්තරායකර ඖෂධ භාවිතය හා එහි ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සමාජ සංවර්ධනය ඇති කිරීම.		✓		
	➢ මත්පැන් හා දුම්වැටි නිෂ්පාදන මිලදී ගැනීම අධෛර්යමත් කිරීම සඳහා වාර්ෂික බදු වැඩි කිරීම හෝ මිල වැඩි කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීම.				✓
	➢ බීඩි නිෂ්පාදනය සඳහා නව බද්දක් පැන වීමට මූලික කටයුතු සිදු කරමින් පවතින අතර එමගින් බීඩි මිලදිගැනිම අධෛර්යමත් කිරීම හා ලැබෙන ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීම තුලින් ජනතාවට සහන සැලසීම.		✓		
	➢ මත්පැන් හා දුම්කොළ පරිභෝජනය හා එහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මත්පැන් හා දුම්කොළ පරිභෝජනය අවම හෝ අඩු කිරීමට පියවර ගැනීම.		✓		

අරමුණ - 03 සියලු දෙනා සඳහා නිරෝගිමත් ජීවිතයක් සුරක්ෂිත කිරීම සහ සියලු වයස් කාණ්ඩයන්හි යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	➢ නීත්‍යානුකූල ලෙස නිපදවන මත්පැන්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා සම්බන්ධ වී සියලුම මත්පැන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම.				✓
	➢ සෞඛ්‍යය හා ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා නීති විරෝධී මත්පැන් හා දුම්කොළ නිෂ්පාදන ව්‍යාප්තිය අවම කිරීම හා පාලනය කිරීම.				✓
	➢ සඵලදායී නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ ආරක්ෂණය ඇති කිරීම.				✓
	➢ මහජන යහපැවැත්ම උදෙසා අන්තරායකාරී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම.				✓
	➢ වයස අවුරුදු 21 අඩු පිරිස සඳහා මත්පැන් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම පාලනය කිරීම.				✓
	➢ නීති විරෝධීව මහරා නිෂ්පාදනය කිරීම පාලනය කරනු වස් නිශ්චිත ප්‍රමිතීන් තල්,පොල්, කිතුල් සඳහා සකස් කිරීම.			✓	
	➢ මනුෂ්‍ය ජීවිත මත්පැන්වලට ඇබ්බැහි වීමේ අවධානමෙන් වළක්වා ගැනීම සඳහා සියලු මට්ටම්වල වෙසෙන ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.				✓
	➢ මහජනතාවගේ සෞඛයට හිතකර වන ලෙස පරිසර දූෂණය වීම වැළැක්වීම සඳහා මත්පැන් භාවිතයෙන් පසු ඉවත දමන බෝතල් සහ කෑන් එකතු කර ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මත්පැන් අලෙවිසැල් ආශ්‍රිතව කූඩ සවි කිරීම				

අරමුණ - 12 තිරසාර නිෂ්පාදන රටා සහ පරිභෝජන රටා සුරක්ෂිත කිරීම.	➢ මත්පැන් හා දුම්කොළ පරිභෝජනය හා පාලනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ➢ නීතිවිරෝධී මත්පැන් පාලනය කිරීම සඳහා වාර්ෂිකව ඒකපුද්ගල මත්පැන් පරිභෝජනය ගණනය කිරීම සහ ඒ අනුව ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය පාලනය කිරීම. ➢ බදු පරිපාලනය පහසු කිරීමට සහ ආදේශක වෙළඳපොළට පැමිණීම පාලනය හා සෞඛ්‍යාරක්ෂාව සඳහා මත්පැන් සඳහා ආරක්ෂිත ස්ථිකරයක් හඳුන්වා දීම. ➢ ගුණාත්මකභාවයෙන් ඉහළ මත්පැන් හා දුම්කොළ සහතික කිරීම සඳහා මත්පැන් නිෂ්පාදනාගාර හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනාගාර කාර්යක්ෂම හා ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම. ➢ සියලුම මත්පැන් නිෂ්පාදනාගාර සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර සුරක්ෂිතතාවය පිළිබඳ සහතික, බොයිලේරු සහතික හා ජල පිරිසිදු කිරීම් සහතික ලබා දීමට කටයුතු කිරීම.		✓	✓ ✓ ✓	✓ ✓

අරමුණ - 16 තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ අන්තර්ග්‍රාහී සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වලදී ඵලදායී, වගවීමෙන් යුතු සහ අන්තර්ග්‍රාහී ආයතන ගොඩනැගීම.	➢ අන්තරායකර ඖෂධ, නීති විරෝධී මත්පැන් හා දුම්කොළ නිෂ්පාදන පිළිබඳව ඵලදායි ලෙස නීතිය බලාත්මක කිරීම හරහා ප්‍රජාව සඳහා සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පියවර ගැනීම.				✓
	➢ සියලුම නිලධාරීන් නීතිගරුකව රාජකාරී කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් හා පුහුණුව ලබා දීම.				✓
	➢ සියලුම කාර්ය මණ්ඩලය වගවීමෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීම.				✓
	➢ නීති අංශයක් ක්‍රියාත්මක කිරීමෙන් නීත්‍යානුකූල පරිසරයක් තුළ රාජකාරී සිදු කිරීමට සුදුසු පරිසරයක් සැකසීම.				✓
	➢ සියලුම නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා අවම වශයෙන් එක් නිලධාරියෙකුට පැය 12 ක පමණ හෝ ආයතනිකව හෝ බාහිරව පුහුණුව ලබා දීම.			✓	
	➢ කාන්තා නිලධාරිනියන්ට උසස්වීම් සඳහා සමාන අවස්ථා ලබා දීම සහ ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයටම සාධාරණ වැටුපක් සඳහා අවස්ථා ලබා දීමෙන් ස්ත්‍රී පුරුෂ භාවය මත වෙන්කොට නොසැලකීම.			✓	
	➢ නීත්‍යානුකූලව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් හා දුම්කොළ කර්මාන්තයෙන් ලබන ආදායම තිරසාර සංවර්ධනය සඳහා හා ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායීව යෙදවීමට කටයුතු කර දීම තුළින් ඵලදායී සේවා නියුක්තිය සහතික කිරීම.				✓

අරමුණ - 17 තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගතාවය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය	➢ වාර්ෂිකව එකතු කරනු ලබන මත්පැන් හා දුම්කොළ බදු ආදායම රාජ්‍ය භාණ්ඩාගාරයට නිශ්චිතව ලබාදීම හා සුරක්ෂිත කිරීම. ➢ නව තාක්ෂණය හඳුන්වා දීම හරහා ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ERMS සහ RASED ක්‍රම හඳුන්වා දීම ➢ ගෝලීයව ප්‍රචලිත ආරක්ෂක විධිවිධානයක් වන Fool Proof Sticker හෝ digital printing යොදා ගැනීම හරහා සුරාබදු ආදායම ආරක්ෂා කිරීම				✓ ✓ ✓

පරිච්ඡේදය - 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

6.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු

6.4 මානව සම්පත් සංවර්ධනය

6.4.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවන ආකාරය

6.4.2 මානව සම්පත් සංවර්ධනය - පුහුණු වැඩසටහන්

6.1 සේවක කළමනාකරණය

	2022.12.31 දිනට		
	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	68	30	38
තෘතීය	381	304	77
ද්විතීය	1048	845	203
ප්‍රාථමික	142	83	59
එකතුව	**1639**	**1262**	**377**

6.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය





ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2022.09.01 දින සුරාබදු අධිකාරී තනතුරු 11 ක් සඳහා උසස්වීම් ලබා දී ඇත. නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා නව නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලැබී නොමැත.

2022 වර්ෂය තුළ තෘතීය මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම යටතේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 21ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. තව ද සුරාබදු පරීක්ෂක තනතුර සඳහා විවෘත බඳවා ගැනීම යටතේ 2022.03.11 දින නිලධාරීන් 39 දෙනෙකු බඳවා ගෙන ඇත.

ද්විතීය මට්ටමේ තනතුරු අතරින් සුරාබදු සැරයන් තනතුරු 36ක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී.

රජයේ වියදම් සීමා කිරීම යටතේ නව බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දී නොමැති අතර රාජකාරී සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යයන් බොහෝමයක් පසුබෑමට ලක් වී ඇත. නිලධාරීන් වෙත ග්‍රහණ ඉලක්ක ලබාදීම ද මෙලෙස නිලධාරීන් සංඛ්‍යාව අඩු වීම නිසා අපහසු වන අතර මෙය දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු කෙරෙහි සෘජුවම බලපානු ලබයි.

මීට අමතරව 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තු ගත තනතුරු දරණ නිලධාරීන් 242 සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 11ක් පවත්වා ඇති අතර නිලධාරීන් 954ක් සඳහා වැටුප් වර්ධක ලබාදීම ද සිදු කර ඇත. එසේම දීර්ඝ කාලීනව පැවති දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ විනය පරීක්ෂණ ගොනු අවසන් කිරීමට හැකියාව ලැබුණු අතර 2022 වසර තුළ දී එසේ අවසන් කරන ලද විනය ලිපිගොනු සංඛ්‍යාව 11කි.

6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු - 2022 වර්ෂය

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	2022.12.31 දිනට තත්ත්වය	පුරප්පාඩුව පැවති කාලය
සුරාබදු කොමසාරිස් ජනරාල්	1	මෙම තනතුර දැරූ එම්.ජේ.ගුණසිරි මහතා 2022.12.31 දින සිට විශ්‍රාම ලබා ඇත.	දින 01
අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්)	1	මෙම තනතුර සඳහා පත්කිරීමට බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සැපිරූ අයෙකු නොමැති වීම හේතුවෙන් 2020.12.11 දින සිට සුරාබදු කොමසාරිස් එම්.ඩී.එම්.ඩබ්.කේ. දිසානායක මහතා මෙම තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත්කර ඇත. සුරාබදු කොමසාරිස් එම්.ඩී.එම්.ඩබ්.කේ. දිසානායක මහතා 2022.12.31 දින විශ්‍රාම ලබා ඇති බැවින් 2022.12.31 දින සිට සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා මෙම තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත්කර ඇත.	වසර 03
ප්‍රධාන මූල්‍ය නිලධාරී*		ප්‍රධාන ගණකාධිකාරී ජී.ඒ.චාන්දනී මිය 2021.12.01 දින සිට මෙම තනතුරේ පූර්ණකාලීනව වැඩ බලීම සඳහා පත් කර ඇත.	වසර 01 මාස 05
සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ හා සංවර්ධන)	1	2019.02.08 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතින අතර 2021.07.20 දින සිට සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා විසින් රාජකාරී ආවරණය කරනු ලැබූ අතර 2022.12.31 දින සිට නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පී.එච්. සී. සිල්වා මහතා විසින් මෙම තනතුරේ රාජකාරී ආවරණය කරනු ලබයි.	වසර 04
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්)	1	මෙම තනතුර දැරූ සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා 2022.12.31 දින සිට සු.කොා.(ආදායම් හා මෙහෙයුම්) තනතුරට පත්කර ඇති බැවින් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පී.එච්.සී.සිල්වා මහතා 2022.12.31 දින සිට මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇත.	දින 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්(පාලන)	1	එච්.ජී.කේ.දීපශිකා මිය ස්ථාන මාරු වී යාම හේතුවෙන් 2021.10.28 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 01 මාස 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මානව සම්පත්)	1	2018 වර්ෂයේ දී ඇති කරන ලද මෙම තනතුර පුරප්පාඩුව පවතින අතර 2022.12.31 දින සිට සහකාර සුරාබදු කොමසාරිස් ආර්.එම්.එස්.පී.ඒ.කේ. රත්නායක මහතා රාජකාරී ආවරණය සඳහා පත් කර ඇත.	වසර 04

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (යෙදවුම්)	1	2021.11.29 දින සිට පුරප්පාඩුව පවතින අතර, සහකාර සුරාබදු කොමසාරිස් ඒ.ඒ.ඒ.උපුල් කුමාර මහතා 2022.12.31 දින දක්වා මෙම තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත් කර ඇත. එසේම 2022.12.31 දින සිට සහකාර සුරාබදු කොමසාරිස් ආර්.එම්.එස්.පී.ඒ.කේ.රත්නායක මහතා මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත.	වසර 01 මාස 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අධ්‍යයන හා පර්යේෂණ)	1	මෙම තනතුර දැරූ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පී.එච්.සී.සිල්වා මහතා මහතා 2022.12.31 දින සිට සු.කොං(නීති ක්‍රියාත්මක කිරීම්) තනතුරට පත්කර ඇති බැවින් මෙම තනතුරේ රාජකාරී ආවරණය සඳහා සහකාර සුරාබදු කොමසාරිස් ඒ.ඒ.ඒ.උපුල් කුමාර මහතා 2022.12.31 දින සිට පත්කර ඇත.	දින 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ)	1	2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර, 2021.07.20 දින සිට 2022.12.30 දින දක්වා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පී.එච්.සී. සිල්වා මහතා විසින් මෙම තනතුරේ රාජකාරී ආවරණය කරන ලදී.	වසර 04
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (සැපයුම් දාම නියාමන සහ තොරතුරු තාක්ෂණ)	1	මෙම තනතුරේ රාජකාරී ආවරණය කල සහකාර සුරාබදු කොමසාරිස් ආර්.එම්.රත්නායක මහතා 2022.12.31 දින විශ්‍රාම ගොස් ඇති අතර , සහකාර සුරාබදු කොමසාරිස් සී.ජේ.ඒ.වීරක්කොඩි මහතා 2022.12.31 දින සිට මෙම තනතුරේ රාජකාරී ආවරණය කරනු ලබයි.	වසර 02 මාස 03
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්)	1	මෙම තනතුරේ රාජකාරී ආවරණය කල නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් ඒ.එම්.ජේ.අධිකාරී මහතා 2022.12.31 දින විශ්‍රාම ලබා ඇති අතර 2022.12.31 දින සිට සහකාර සුරාබදු කොමසාරිස් ඒ.ඒ.ඒ.උපුල් කුමාර මහතා වැඩ බැලීම සඳහා පත්කර ඇත.	දින 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්/ බලපත්‍ර)	1	මෙම තනතුර දැරූ සුරාබදු කොමසාරිස් ආර්.එම්.රත්නායක මහතා 2022.12.31 දින විශ්‍රාම ලබා ඇති බැවින් 2022.12.31 දින සිට සහකාර සුරාබදු කොමසාරිස් කේ.ධර්මසීලන් මහතා මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇත.	දින 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති)	1	මෙම තනතුර දැරූ ඒ.එම්.ජේ.අධිකාරී මහතා 2022.12.31 දින විශ්‍රාම ලබා ඇති අතර 2022.12.31 දින සිට සහකාර සුරාබදු කොමසාරිස් සී.ජේ.ඒ.වීරක්කොඩි මහතා මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත.	දින 01
ගණකාධිකාරී	1	ආර්.බී.එස්. ප්‍රියදර්ශනී මිය 2021.07.01 දින ස්ථාන මාරු වී යාම හේතුවෙන් මෙම තනතුර පුරප්පාඩුව පවතින අතර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී ඩබ්.ඒ.ඩී.පී. විජේසිංහ මහතා මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත.	වසර 01 මාස 05

සහකාර සුරාබදු කොමසාරිස්	7	2022 වර්ෂයේ ස.සු.කො. නිලධාරීන් විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු	
		1. බී.ඒ.දයාරත්න මහතා - 2022.12.31 2. එම්.එම්.යූ.බී.සෙනවිරත්න මහතා - 202212.31 3. පී.එන්.ආර්.ජයවික්‍රම මහතා - 2022.12.31 4. එන්.සුසාදරන් මහතා - 2022.12.31	දින 01
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	1	මෙම තනතුර සඳහා නිලධාරියෙකු පත්කර දෙන ලෙස මුදල් අමාත්‍යාංශය මගින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.	වසර 06
සුරාබදු අධිකාරී	16	2022 වර්ෂයේ සුරාබදු අධිකාරී නිලධාරීන් විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු	
		1. කේ.ජී.එල්.පෙරේරා මහතා - 2022.02.11	මාස 10
		2. එච්.එච්.ඩි.ජයවර්ධන මහතා - 2022.12.31 3. එස්.මදන්මෝහන් මහතා - 2022.12.31 4. ආර්.ඒ.ඩී.ඉන්ද්‍රනාත් මහතා - 2022.12.31 5. ආර්.එම්.සේනාරත්න මහතා - 2022.12.31 6. ඩබ්.එස්.ආර්.එෆ්.ප්‍රනාන්දු මහතා - 2022.12.31	දින 01
නීති නිලධාරී	1	මෙම තනතුර සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිලධාරියෙකු නම් කර ඇති අතර එම නිලධාරියා බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලැබී නොමැත.	වසර 03

6.4 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අංශයේ මෙහෙවර ලෙස සුරාබදු දෙපාර්තමේන්තුව සතු මානව සම්පත දැනුම කුසලතා හා ආකල්ප වලින් සංවර්ධනය කරමින්, ආයතනික මෙන්ම පුද්ගල අභිවෘද්ධිය සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් නිවැරදිව සංවිධානය කිරීම වේ. මෙම කාර්ය මෙහෙයවීම සඳහා මානව සම්පත් අංශය සුරාබදු කොමසාරිස්වරයෙකු හා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකුගේ සෘජු අධීක්ෂණය මත ක්‍රියාත්මක වේ. සුරාබදු දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා සුරාබදු විද්‍යාලය යොදාගන්නා අතරම ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය හා බාහිර ආයතන සතු ස්ථානයන්ද මේ සඳහා උපයෝග කරගනී.

2022 වසර සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව සමස්ථ නිල ඇඳුම් කාර්ය මණ්ඩලය මෙන්ම දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා කාර්ය මණ්ඩලය සඳහා අවම පැය දොළහක පුහුණුවක් ලබාදීමට තීරණය කර තිබුණි. නමුත් කොවිඩ් 19 වසංගතය හා රටේ පවතින ආර්ථික අර්බුදය මත ප්‍රතිපාදන සීමාවීම නිසා එම ඉලක්කය වෙත ලහා වීමට නොහැකි වුවද අත්‍යාවශ්‍යය පුහුණුවීම් සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කිරීමට හැකියාව ලැබුණි. 2022 වසර තුළදී මානව සම්පත් අංශයේ සෘජු මැදිහත්වීම සිදුකරන ලද පුහුණු වැඩසටහන් ගණන එකොළහක් වන අතර මේ සඳහා නිලධාරීන් 534 දෙනෙකු සහභාගි වී ඇති අතර ඒ සඳහා වැය වූ මුදල රු. 3,649,682.79 වේ. ප්‍රතිපාදන සීමාවීම් නිසා සමහර පුහුණු වැඩසටහන් සඳහා පුහුණුවන්නන් විසින්ම පාඨමාලා ගාස්තු ගෙවා ඇති අතර සමහර පාඨමාලා වෘත්තීය සංගම් මැදිහත්වීම මත සිදුකර තිබේ.

2022 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන් අතර නවක සුරාබදු පරීක්ෂකවරු බදවා ගැනීමට අදාල නේවාසික පුහුණු පාඨමාලාව, නිෂ්පාදනාගාර, ස්කාගාර, ගුදම් හා බෝතල් රා නිෂ්පාදනාගාර රාජකාරී සඳහා අනුයුක්ත සුරාබදු ස්ථානාධිපතිවරුන්ගේ පුහුණුව, දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් අත්මිදීම සඳහා වන මනෝ උපදේශන පුහුණු පාඨමාලාව, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත බලගැන්වීම පිළිබඳ පුහුණුව,දෙමළ භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පාඨමාලාව, පද්ධති විශ්ලේෂණය පිළිබඳ අන්තර්ජාතික පුහුණුව, කාර්යාලීය උපකරණ පාලනය පිළිබඳ පුහුණුව, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව, මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධ M Cash හා Easy Cash විශ්ලේෂණය පිළිබඳ පුහුණුව ආදී වශයෙන් පුහුණු වැඩසටහන් රාශියක් පවත්වා නිලධාරීන් දැනුමෙන් පෝෂණය කර මානව සම්පත සංවර්ධනයට කටයුතු කර ඇත.

6.4.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවන ආකාරය

කිසියම් ආයතනයක සතු වැදගත්ම සම්පත ලෙස හඳුනාගනු ලබනුයේ මානව සම්පත් වේ. එය ආයතනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා නිසි අයුරින් සකස් කිරීමේ වගකීමක් මානව සම්පත් අංශය වෙත පැවරේ. ආයතනික පරමාර්ථ මෙන්ම පුද්ගල අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සේවක පුහුණුව හා සේවක සංවර්ධනය අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් ලෙස සලකනු ලබයි. සේවක කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය ඉහළ නැංවීම සඳහා සේවකයා තුල ආත්ම විශ්වාසයක් ඇති කිරීම සේවක පුහුණුව තුළින් බලාපොරොත්තු වන අතර සේවකයාගේ අනාගත ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම සඳහා සේවක පොදු හැකියාව ඉහළ නැංවීම සංවර්ධනය තුළින් බලාපොරොත්තු වේ. මෙමගින් දැනුම කුසලතා හා ආකල්ප යාවත්කාලීන වීම, සේවක කාර්ය සාධනය හා සේවක අභිප්‍රේරණය ඉහළ යාම, සේවක පිරිවැටුම අඩුවීම, රැකියා තෘප්තිය ඉහළ යාම, උසස්වීම් සඳහා පවතින අවස්ථා පුළුල්වීම, ආදී ප්‍රතිලාභ පුහුණුව හා සංවර්ධනය තුළින් ඇති වේ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව හා සඵලදායීව ළඟාකර ගැනීමට සුදුසු අයුරින් යෝග්‍ය මානව සම්පතක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පුහුණුව හා සංවර්ධනය සඳහා මානව සම්පත් අංශය සෘජු මැදිහත්වීමක් සිදු කරනු ලබයි.

කොවිඩ් 19 වසංගතයේ බලපෑම 2022 වසර තුලද යම්තාක් මට්ටමකින් පැවැත්වුණු අතරම උත්සන්න වූ දේශපාලනික හා ආර්ථික අර්බුදයේ බලපෑම මත ප්‍රතිපාදන දැඩි ලෙස සීමාවීම් වලට ලක්වීම නිසා සැලසුම් කල පුහුණු වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙහි බලපෑම කෙතරම්ද යත් 2022 වසර තුළ මානව සම්පත් අංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 2.5 ක් තරම් අවම මට්ටමක විය. කෙසේ නමුත් 2022 වර්ෂය අවසානය වන විට රුපියල් මිලියන 3.7 කට ආසන්න මුදලක් පුහුණු වැඩසටහන් සඳහා වැය කිරීමට හැකිවීම ද මානව සම්පත් අංශය ලද විශේෂී ජයග්‍රහණයක් වේ. කෙසේ නමුත් ප්‍රතිපාදන සීමා වීම මත බාහිර ආයතන මගින් නොමිලේ පවත්වනු ලබන පුහුණු වැඩසටහන් පිළිබඳව අවධානය යොමු කරමින් එම වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කිරීමට මානව සම්පත් අංශය කටයුතු කර ඇත. මීට අමතරව නිලධාරීන්ගේ හා වෘත්තිය සංගම් වල දායකත්වය මත ප්‍රමුඛ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා මානව සම්පත් අංශය මැදිහත්වීම් සිදුකර තිබේ.

2022 වසරේදී පුහුණුවට වැඩසටහන් 11ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරීන් 534 දෙනෙකු සහභාගී වී තිබේ. නවක සුරාබදු පරීක්ෂකවරු බදවා ගැනීමට අදාල නේවාසික පුහුණු පාඨමාලාව මානව සම්පත් අංශය විසින් සුදු කරන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන වන අතර දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් පවත්වන ලද දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් අත්මිදීම සඳහා වන මනෝ උපදේශන පුහුණු පාඨමාලාව හා දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත බලගැන්වීම පිළිබඳව පුහුණුව සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත නොමිලේ පිරිනමන ලද වැඩසටහනක් ලෙස විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මානව සම්පත් අංශය විසින් සිදුකරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරයක් පහත සඳහන් වේ.

6.4.2 මානව සම්පත් සංවර්ධනය - පුහුණු වැඩසටහන්

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)	නිමැවුම් /ලබා ගත් දැනුම
1.	නවක සුරාබදු පරීක්ෂකවරු බඳවා ගැනීමට අදාල නේවාසික පුහුණු පාඨමාලාව	38	මාස 2 1/2	3,463,922.79	සුරාබදු පරීක්ෂක තනතුරට ආළව සුරාබදු දෙපාර්තමේන්තුවේ දිශානතිය, නියෝග, සුරාබදු නිවේදන, කාර්ය පටිපාටික නීතිය, හරයාත්මක නීතිය හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කාර්යාල ලේඛන හා නායක්ත්වය පිළිබඳ පුහුණුව
2.	නිෂ්පාදනාගාර රාජකාරී සඳහා අනුයුක්ත සුරාබදු ස්ථානාධිපතිවරුන්ගේ පුහුණුව	19	දින 01	27,450.00	මත්පැන් නිෂ්පාදනාගාර සම්බන්ධ ලේඛන පවත්වාගෙන යාම හා අධීක්ෂණය සම්බන්ධ දැනුම
3.	ස්කාගාර, ගුදම් හා බෝතල් රා නිෂ්පාදනාගාර රාජකාරී සඳහා අනුයුක්ත සුරාබදු ස්ථානාධිපතිවරුන්ගේ පුහුණුව	18	දින 01	28,420.00	ස්කාගාර, ගුදම් හා බෝතල් රා නිෂ්පාදනාගාර සම්බන්ධ ලේඛන පවත්වාගෙන යාම හා අධීක්ෂණය සම්බන්ධ දැනුම
4.	දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් අත්මිදීම සඳහා වන මනෝ උපදේශන පුහුණු පාඨමාලාව	13	දින 10	දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) ආයතනය විසින් නොමිලේ පවත්වා ඇත.	දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් අත්මිදීම සඳහා වන මනෝ උපදේශනාත්මක දැනුම

5.	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත බලගැන්වීම පිළිබඳ පුහුණුව	20	දින 01	දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) ආයතනය විසින් නොමිලේ පවත්වා ඇත.	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත අනුව නඩු පැවරීම හා ප්‍රයෝගික කටයුතු පිළිබඳ අවශ්‍ය දැනුම
6.	දෙමළ භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පාඨමාලාව	200	පැය 200	වෘත්තීය සංගම් විසින් පාඨමාලා ගාස්තු දරා ඇත.	දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය
7.	දෙමළ භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පාඨමාලාව	100	පැය 150	112,500.00	දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය
8.	පද්ධති විශ්ලේෂණය පිළිබඳ අන්තර්ජාතික පුහුණුව	01	දින 02	ඉන්දීය රජය විසින් පාඨමාලාව නොමිලේ පවත්වා ඇත.	පද්ධති විශ්ලේෂණය පිළිබඳ දැනුම
9.	කාර්යාලීය උපකරණ පාලනය පිළිබඳ පුහුණුව	02	දින 02	7,500.00	කාර්යාලීය උපකරණ පාලනය පිළිබඳ දැනුම
10.	නියෝජය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව,	23	පැය 72	සහභාගිවන්නන් විසින් පාඨමාලා ගාස්තු දරා ඇත.	රාජ්‍ය සේවය හා එහි ව්‍යුහය, සාමාන්‍ය කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, ආයතන සංග්‍රහය, පරිපාලන නීතිය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම
11.	මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධ M Cash හා Easy Cash විශ්ලේෂණය පිළිබඳ පුහුණුව	100	දින 01	9890.00	M Cash හා Easy Cash යොදා ගනිමින් ජාවාරම්කරුවන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැනුම
පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		**534**		**3,649,682.79**	

පරිච්ඡේදය - 07

අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූල තත්ත්ව (අනුකූල වේ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	1.ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	2. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	3. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.6	වෙනත්	අදාළ නොවේ	4. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් (GAN20) ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික වාර්තාව සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
05	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 133කින් සමන්විත වන අතර නිලධාරීන්ගේ ඌනතා සහ වැඩ අධික වීම මත පිළිතුරු ලබා දීම ප්‍රමාද වී ඇත.	ඉදිරියේදී නියමිත දිනට පිලිතුරු ලබා දීමට කටයුතු කරමි.
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ශාඛා කාර්යාල වලින් පිලිතුරු ලැබීමට මසකට වැඩි කාලයක් ගතවීම.	විගනන හා කළමනාකරන කමිටු වලදී දැනුවත් කර කඩිනමින් පිළිතුරු ලබා ගැනීමට ක්‍රියා කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 404 (4) උප වගන්තිව ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණ**			
8.1	අංක 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	පැවති ඉන්ධන හිඟය සහ දැනට ක්‍රියාත්මක ඉන්ධන කෝටා ක්‍රමය (QR)හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත.	මෙම සීමාවන් ඉවත් වූ වහාම ආරම්භ කරනු ලැබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජන**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයේ උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	හිඟහිටි ණය ශේෂ මේ වන විට අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	ණය නොගෙවූ අවස්ථාවලදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොත් ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල නොවේ	කාර්ය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කෙරේ.	ඇමුණුම 1 මගින් ඉදිරිපත් කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලබාදීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසාව/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනත 08 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් හෝ වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	අදාළ අංශය වෙත යොමුකර ඇත.	මේ වන විට සකස් කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	අදාළ අංශය වෙත යොමුකර ඇත.	අධීක්ෂණය හා ඇගයීම සඳහා ද ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර ඇත.
19	**මානව සම්පත් සැලසුම් සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම සඳහාම වර්ෂයකට අවම වෂයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	2022 වර්ෂය සඳහා පුහුණුවීම් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සීමාවීම හේතුවෙන්	පුහුණු වීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදී කොට තිබීම	අනුකූල වේ.		

පරිච්ඡේදය - 08

ඇමුණුම

8.1 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

8.2 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - සුරාබදු තැගි අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පියූඅාර්/ඊ/ඊඑක්ස්ඩී/2022/30

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
31 MAY 2023
සුරාබදු කොමිසාරිස් ජනරාල් කාර්යාලය

සුරාබදු කොමසාරිස් ජනරාල්,

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව සහ විගණිත මුල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ඊ.එම්.කේ.එම්.පද්මලාල්

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ඊ.එම්.කේ.එම්.පද්මලාල්

ජ්‍යෙෂ්ඨ සහකාරවිගණකාධිපති

නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

පිටපත :-
01 අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
02 ලේකම්, මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීයූආර්/ඊ/ඊඑක්ස්ඩි/2022/30 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 30 දින

සුරා බදු කොමසාරිස් ජනරාල්
සුරා බදු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ගෙ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022 ජනවාරි මස ස්ටිකර් ආදායම, ආදායම් වාර්තා අනුව 100,518,676 ක් වුව ද, මාසික ගිණුම් සාරාංශය අනුව ස්ටිකර් ආදායම රු.98,388,676 ක් වී මෙන් රු. 2,130,000ක ස්ටිකර් ආදායම් මුදලක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල 19ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ රැස් කර බැංකු ගත කර ඇති සුරාබදු ආදායමට ඇතුළත් විය යුතු ඉල්ලුම් පත්‍ර ගාස්තු රු.

10,505,600ක් ද පොල් ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු රු. 4,505,275ක් හා රා එකතු කිරීමේ මධ්‍යස්ථාන ගාස්තු රු. 1,375,000ක එකතුව වූ රු. 16,385,875 සුරාබදු ආදායමක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 19ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ රැස් කර බැංකු ගත කර තිබුණු රු.99,650 ක දුම්කොළ බදු ආදායමක් ගිණුම්වල අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 19ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ රැස් කර බැංකු ගත කර ඇති රජයේ ආදායමට බැර විය යුතු රු.1,256,267ක ආදායමක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඉ) ආදායම් වර්ගීකරණය කිරීමේ දී, රු. 1,875,000ක් සහ රු. 55,440ක් වූ පානීය නොවන ස්ප්‍රිතු ආදායමක් ප්‍රමාද දෝෂයකින් විදේශ මත්පැන් ආදායමක් ලෙසත්, රු. 931,500ක් වූ විදේශ මත්පැන් ආදායමක් ආනයනික මෙතනෝල් බදු ආදායමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

(අ) **මත්පැන් අපනයනය මත සුරාබදු මුදල් අවකරණය**

2019 දෙසැම්බර් 27 දිනැති අංක 2155/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය පළ වූ අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ සඳහන් ස්වභාවය වෙනස් නොකරන ලද පානීය සහ විකිණීම සඳහා අදහස් කරන බෝතල්ගත කරන ලද මත්පැන් අපනයනය සම්බන්ධව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ බදු අවකරණ වාර්තාව අනුව නිෂ්පාදන ආයතන 03කට අදාළව අවස්ථා 26ක දී මත්පැන් ලීටර 12,211,501ක් අපනයනය වෙනුවෙන් රු. 5,152,864,440ක් වූ සුරාබදු මුදල් අවකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 වර්ෂයට අදාළව නිෂ්පාදනාගාර විසින් දේශීයව නිපදවන මත්පැන් අපනයනය මත නිෂ්පාදන බදුවලින් අදාළ අවකරණයන් අඩු කිරීමෙන් පසු ශුද්ධ සුරාබදු ආදායම ගිණුම්ගත කර තිබුණු අතර සුරාබදු අවකරණ වටිනාකම වියදමක් ලෙස නිරූපණය කර නොතිබුණි.

(ii) අවකරණ සම්බන්ධ නිශ්චිත ගිණුම් ක්‍රමවේදය සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා හඳුනා ගෙන නොතිබුණි මේ තත්ත්වය මත සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් භාණ්ඩාගාර ගිණුම්වල ද මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු නිරූපණය වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(iii) මත්පැන් නිෂ්පාදකයින් විසින් රජයට ගෙවිය යුතු සම්පූර්ණ බදු මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඔවුන්ට ලබා දෙන බදු සහනය ආදායමින් ආපසු ගෙවීමක් ලෙස ගිණුම්ගත කළ යුතු බවත්, මුදල් රෙගුලාසි 118 අනුව ආදායමින් ආපසු ගෙවීමේ බලය සුරාබදු කොමසාරිස්

ජනරාල්ට ලැබෙන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීම සුදුසු බවත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු විසින් නිර්දේශ කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) අපනයනය කරනු ලබන මත්පැන්වලට අදාළ බදු මුදල් ආපසු ගෙවීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයක් ලබා දී ඊට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් වෙන් කර දෙන ලෙස හා එම වැය විෂය මඟින් සුරාබදු අවකරණය ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ආපසු ගෙවීම් සඳහා වැය විෂයක් යටතේ ප්‍රතිපාදන ලැබී නොතිබුණි.

(ආ) ස්ටිකර් ව්‍යාපෘතිය සඳහා ගෙවීම්

පහත කරුණු නිරීක්ෂනය විය.

(i) සමාලෝචිත වර්ෂය දක්වා දේශීය මුද්‍රිත ස්ටිකර් 217,210,000ක් මිල දී ගැනීම සඳහා කොන්ත්‍රාත් සමාගමට රු. 494,921,349ක මුදලක් ද, විදේශීය මුද්‍රිත ස්ටිකර් 12,016,135ක් මිල දී ගැනීම සඳහා රු. 14,495,480ක මුදලක් ද ගෙවා තිබූ අතර, 2022 වර්ෂය තුළ මිල දී ගන්නා ලද දේශීය මත්පැන් සඳහා භාවිත කරනු ලබන ඩිජිටල් ස්ටිකර් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමට ඇ.ඩො.2,249,245ක මුදලින් විගණන දිනය වන විට ඇ.ඩොලර් 500,000ක් පමණක් නිරවුල් කර තිබුණි. ඉතිරි ඇමරිකන් ඩොලර්1,749,245කට අදාළ බිල්පත් නිරවුල් කිරීමට ප්‍රමාද වී තිබුණි. තව ද ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාතුව පුද්ගලික සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර තිබුණු අතර ගෙවීම් කිරීමේ දී ගිවිසුම් ප්‍රකාර අදාළ පද්ධතිය ස්ථාපිත කිරීමේ සියලුම කාර්යයන් නිම වී තිබුණේ ද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

(ii) දේශීය මුද්‍රිත ස්ටිකරයක් සඳහා රු. 2.27ක මුදලක් ද ඩිජිටල් ස්ටිකරයක් සඳහා රු. 2.19ක ද වැය වන බව නිරීක්ෂණය විය. මේ අනුව දේශීය මුද්‍රිත ස්ටිකර් හා ඩිජිටල් ස්ටිකර් සඳහා නිෂ්පාදන සමාගම්වලින් ස්ටිකරයක් සඳහා අය කරනු ලබන රු. 2ක මුදල ඉක්මවා කොන්ත්‍රාත් සමාගම වෙතින් ස්ටිකරයක් මිල දී ගැනීමට වැය කර තිබුණි.

(iii) ස්ටිකර් මිල දී ගැනීමේ දී විදේශ මුදලින් කොන්ත්‍රාත් සමාගමට ගෙවීමට සිදුවීම නිසා අමතරව බැංකු කොමිස් හා සේවා ගාස්තු ස්ටිකරයක් වෙනුවෙන් වැය වන පිරිවැය වැඩි විය හැකි බැවින් දෙපාර්තමේන්තුවට සිදු වන පාඩුව මඟ හරවා ගැනීම සඳහා අවධානය යොමු වී නොතිබුණි.

1.6.3 අග්‍රිම සැසදුම් ප්‍රකාශයේ ශේෂය

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල 19 ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ 0007041628 ගිණුමට රැස්කර බැංකු ගත කර තිබුණු රු. 28,716,637 ක් මහා භාණ්ඩාගාරයට අඩුවෙන් පියවා තිබුණි.

විස්තරය	ආදායම රු.
සුරාබදු ආදායම	16,385,875
දුම්කොළ බදු ආදායම	99,650
රජයේ ආදායමට බැරවිය යුතු ආදායම	1,256,267
ඇප තැන්පත්	363,250
සමඵ ගාස්තු	9,651,195
සිගරට් දඩ	960,400
එකතුව	28,716,637

1.6.4 මූල්‍ය නොවන වත්කම්

ආයතනය සතුව ඉඩම් ලේඛනයේ ඇති ඉඩම් 45න් ඉඩම් 15ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව අංක SA/GFS/01/01/08 දින 2021 ජූලි 26 මඟින් සියලුම රාජ්‍ය ආයතන මුල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වුව ද සමාලෝචිත වර්ෂයේ පවරා ගෙන තිබුණු ඉඩම් 30කින් තක්සේරු කර තිබුණේ ඉඩම් 05ක් පමණක් වන අතර එහි වටිනාකම ගිණුම්ගත කිරීම හෝ හෙළිදරව් කර නොතිබුණි.

1.6.5 තැන්පතු ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලද ඇප තැම්පත් 04කට අදාළ එකතුව රු 363,250ක් වූ ඇප තැම්පත් මුදල් අංක 6000-0-0-1-0-122 දරන ඇප තැම්පත් ගිණුමට ඇතුළත් වී නොතිබුණි.

1.6.6 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) 2022 වර්ෂයේ මාසික ගිණුම් සාරාංශ අනුව ගිණුම් අංක 0007041629 ගිණුමට බැර වූ රු.163,335,504,699ක් වූ සුරාබදු ආදායමට අවස්ථා 04ක දී ගැලපීම් කර තිබූ රු.4,345,717කට අදාළ ජර්නල් සටහන් සහ අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) 2022 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.165,187,536,555ක සුරාබදු ආදායම සහ මාසික ගිණුම් සාරාංශ අනුව සුරාබදු ආදායම රු.165,189,373,127ක් අතර වෙනස වූ ආදායමින් ආපසු ගෙවීම් කර තිබුණු රු.1,836,572ක මුදලක් සඳහා අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

ලේඛන වර්ග	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
ප්‍රාදේශීය කාර්යාල		
• මුදල් පොත්	මුදල් රෙගුලාසි 446	යාවත්කාලීන කර නොතිබුණි
• තොග ලේඛන	මුදල් රෙගුලාසි 445	
• සුළු මුදල් පොත්	මුදල් රෙගුලාසි 446	
ප්‍රධාන කාර්යාලය		
• ඉඩම් ලේඛනය	මුදල් රෙගුලාසි 502(2)	
• වැය ලෙජරය	මුදල් රෙගුලාසි 447	
• ස්ථාවර වත්කම් ලේඛනය	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය	

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත සුරාබදු ආදායම වර්ෂයේ කාර්තු 04 තුළ රු.බිලියන 45 බැගින් රු. බිලියන 180ක් සමානව අය කර ගැනීමට සැලසුම් කර තිබුණි. විගණනය වෙත ලබා දෙන ලද කාර්තුමය ප්‍රගති වාර්තාවන් තුළ පළමු කාර්තුව සඳහා රු.බිලියන 47.33ක්, දෙවන කාර්තුව සඳහා රු.බිලියන 42.47ක්, තුන්වන කාර්තුව සඳහා රු.බිලියන 43.68ක් හා හතරවන කාර්තුව සඳහා රු.බිලියන 46.52ක් වශයෙන් සංශෝධනය වී තිබුණි. දෙවන හා තෙවන කාර්තු තුළ අපේක්ෂිත ආදායම සියයට 05 සිට සියයට 15 දක්වා පරාසයකින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සුරාබදු ආදායම රු. බිලියන 180 සිට රු. බිලියන 185 දක්වා සංශෝධනය වී තිබුණ ද, ඒ අනුව බලපත්‍රලත් සැර මත්පැන් නිෂ්පාදනාගාරවල ආදායම් ඉලක්ක සංශෝධනය වී නොතිබුණි. එක් එක් සැර මත්පැන් නිෂ්පාදනාගාරවල මුල් ආදායම් ඉලක්ක හා 2022 වර්ෂයේ මුල් මාස 09 තුළ අය වූ ආදායම් පරීක්ෂාවේ දී ආයතන 04කින් පමණක් සියයට 03 සිට සියයට 64 දක්වා පරාසයකින් ලබා දී තිබුණු ඉලක්කගත ආදායම් සිමාව ඉක්වා තිබුණි. සැප්තැම්බර් 30 දිනට සැර මත්පැන් නිෂ්පාදන ආයතනවලින් ඉලක්ක සපුරා නොගත් ප්‍රතිශතය සියයට 08 සිට සියයට 100 ත් අතර පරාසයක තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බලපත්‍රලත් සැර මත්පැන් නිෂ්පාදනාගාර 20 ක් සම්බන්ධයෙන් මුල් මාස 09ක කාලච්ඡේදයට අදාළව නිපද වූ මත්පැන් නිෂ්පාදන බදු ආදායම හා එක් එක් නිෂ්පාදන සමාගමේ වෙළඳපල කොටස හා එමඟින් සුරාබදු ආදායමට වන දායකත්වය පිළිබඳ තොරතුරු පරීක්ෂාවේ දී සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 18ක් මුළු ආදායමට සියයට 68.80ක දායකත්වයක් ලබා දී තිබුණ ද එම මත්පැන් නිෂ්පාදන සමාගම් 18න් මුළු ආදායමින් සියයට 89.19ක දායකත්වයක් ලබා දී තිබුණේ සමාගම් 3ක් වීම හේතුවෙන් සැර මත්පැන් නිෂ්පාදන ආදායම ප්‍රධාන සමාගම් 03ක් මත රැඳී තිබෙන බව නිරීක්ෂණය විය. ඉතිරි සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 15හි ආදායමට දායකත්වය සියයට 10.81ක මට්ටමක පැවතුණි. තව ද ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය මඟින් සුරාබදු ආදායමට වන දායකත්වය පිළිබඳ තොරතුරු පරීක්ෂාවේ දී ධාන්‍ය මත්පැන් නිෂ්පාදන සමාගම් 2ක් විසින් සුරාබදු ආදායමට සියයට 31.20 ක දායකත්වයක් දක්වා තිබුණි.

(ඈ) ආදායම් ඉලක්ක පිළියෙල කිරීමේ දී එක් නිෂ්පාදන ආයතනය වෙතින් සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළ රු.82,201,411ක් අපේක්ෂා කර තිබුණ ද එම ආයතන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අපේක්ෂිත ආදායම අහිමි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ බොතල් රා නිෂ්පාදනාගාර 45ක් පැවති අතර ඉන් පොල් රා බෝතල් නිෂ්පාදනාගාර 16කින් රු. 525,726,800ක් හා තල් රා බෝතල් නිෂ්පාදනාගාර 29කින් රු 46,597,081ක් වශයෙන් එකතුව රු. 572,323,881ක මුළු ආදායමක් උපයා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පොල් රා නිෂ්පාදනාගාර 1ක් සහ තල් රා නිෂ්පාදනාගාර 5ක් අක්‍රීය තත්ත්වයේ පැවතීම හේතුවෙන් කිසිදු බදු ආදායමක් ලැබී නොතිබුණු අතර, පොල් රා නිෂ්පාදනාගාර 03ක් තල් රා නිෂ්පාදනාගාර 10ක් මාස 03ත් මාස 10ත් අතර කාල පරාසයක ආදායම් ලැබී නොතිබුණි. ඒ සම්බන්ධව පසු විපරමක් ද සිදු වී නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා සුරාබදු නිවේදන 991 අනුව සැර මත්පැන් නිෂ්පාදන ආයතන 23කින් 07කට අදාළව රු. 11,237,675 ක් සුරාබදු නිවේදනය යටතේ ඉඩ දෙන සීමාව ඉක්මවා සිදු වන අපතයන් වෙනුවෙන් නිෂ්පාදනයේ නියමිත අපතය සඳහා ද බදු මුදල් අය වී තිබුණු අතර සැර මත්පැන් නිෂ්පාදන ආයතන 17 ක අපතය සඳහා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි. මේ අනුව නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදුවන අපතයන් සඳහා ඉඩදෙන සීමාව ඉක්මවා සිදුවන අපතයන් සඳහා

සුරාබදු මුදල් අය කර ගැනීම සම්බන්ධ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බවට විගණනයට තහවුරු නොවුණි. ක්ෂේත්‍ර පරීක්ෂණ වලදි නිරීක්ෂණය වූ හංවැල්ලේ පිහිටි එක් නිෂ්පාදනාගාරයකින් ඉඩදෙන සීමාව ඉක්මවා සිදු වී තිබූ සංශුද්ධ මධ්‍යසාර ලීටර් 8,307.2 කට අදාළ අපත මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය වී නොතිබුණි.

(උ) විදේශීය මත්පැන් ආනයනයන

2019 දෙසැම්බර් 27 දිනැති අංක 08/2019 දරණ සුරාබදු නිවේදනයේ වූ විධිවිධානවලට අනුකූලව සමාලෝචිත වර්ෂයේ මාස 09 ක කාලයට අදාලව විදේශීය මත්පැන් ආනයනයන් හා ආදායම රැස්කිරීම සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේදී ලියාපදිංචි වී තිබූ විදේශීය මත්පැන් ආනයනකරුවන් 33 ක් අතරින් ආනයනකරුවන් 13 දෙනෙකු විසින් අවස්ථා 133 කදී විදේශීය මත්පැන් ආනයනය කිරීම වෙනුවෙන් රු.172,928,367 ක බදු ආදායමක්ද, දේශීය මත්පැන් නිෂ්පාදන ආයතන 04 ක් විසින් අවස්ථාවන් 82 කදි සිදුකළ විදේශීය මත්පැන් ආනයනය කිරීම වෙනුවෙන් රු.128,358,313 ක බදු ආදායමක්ද හා පුද්ගලයින් 03 දෙනෙකු විසින් අවස්ථා 03 කදී පුද්ගලික පරිභෝජනය සඳහා මෙරටට විදේශීය මත්පැන් ආනයනය කිරීම වෙනුවෙන් රු.43,058 ක බදු ආදායමක්ද රැස් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බලපත්‍රලාභී ආනයන ආයතන 13 අතුරින් ආයතන දෙකක් අවස්ථා 39 ක දී රු.120,151,976 ක් ද, ඉතිරි ආයතන 11 ක් අවස්ථා 94 ක දී රු. 52,796,392 ක බදු ආදායමක් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන තිබුණි.

(ii) තව ද විදේශීය මත්පැන් ආනයනය කිරීමේ අයදුම්පත්‍ර පරීක්ෂාවේ දී සුරාබදු නිවේදන 08/2019 හි I උපලේඛනය මඟින් විදේශීය මත්පැන් ආනයනය කිරීම සඳහා අවසර පත්‍රවල අයදුම්පත් පරීක්ෂා කිරීමේ දී ආයතන 04 ක අයදුම්පත් 38ක අනුමැතිය දීමට අදාළ කොටස සම්පූර්ණ කර නොතිබුණි.

(iii) එක් සමාගමක ලිපිගොනුවේ සටහන් තුළ ආනයන බලපත්‍ර 07 ක් සඳහා කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී නොතිබිණි. තව ද එම ආයතනයේ විදේශීය මත්පැන් ආනයනය කිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය, ආනයනය කිරීම සිදු කරන අයගේ ලිපිනය හා නාම මාත්‍ර ඉන්වොයිසිය සඳහා මිල ගණන් කැඳ වූ ලිපිනය එකිනෙකට සමාන නොවූ අවස්ථාවන් 10 ක් නිරීක්ෂණය විය.

(ඌ) සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2022 සැප්තැම්බර් මස 05 දිනැති අංක LB/SPIRIT/ROCKLAND/VOL-VII දරන නැවත ලේඛන ගත කරනු ලැබූ මත්පැන් සඳහා අය කර ගත් බදු මුදල් නැවත ගෙවීම මැයින් නිකුත් කළ ලිපිය මඟින් එක් මත්පැන්

නිෂ්පාදනාගාරයක් සඳහා නැවත ලේඛනගත කරනු ලැබූ මත්පැන් සංශුද්ධ මධ්‍යසාර ලීටර 9,015 ක් වෙනුවෙන් අනුමැතිය ලබා දීමට බලපාන ලද කරුණු දැක්වීමකින් තොරව අය කර ඇති රු 30,763,726 ක් වූ සුරාබදු ආදායමක් අවකරණය කර තිබුණි.

(එ) බීඩි කර්මාන්තයට අදාළව බදු අය කිරීම.

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සහ සුරුට්ටුවක් සඳහාම බද්දක් පැනවීම, භාවිත කරනු ලබන බීඩි / සුරුට්ටු දුම්කොළ අමුද්‍රව්‍ය ප්‍රමාණය මත බද්දක් පැනවීමට සහ දුම්කොළ මෙන්ම නිෂ්පාදින බීඩි / සුරුට්ටු ප්‍රවාහන අවසර පත්‍රයක් හඳුන්වා දීමට අදාළ නියමයන් ඇතුළත් කරමින් දුම්කොළ නිෂ්පාදන සඳහා වන බදු සම්බන්ධයෙන් යෝජනා 2019 අගෝස්තු 26 දිනැති සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අංක ED/2019 දරන ලිපිය මඟින් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබුණ ද, අදාළ බදු අය කිරීමේ නිවේදනය 2022 දෙසැම්බර් 31 දින නිකුත් වී තිබුණේ ඉදිරි වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි විය. තව ද බීඩි පරිභෝජනය තුළින් ආඝ්‍රානය වන දුම ශරීරයට අහිතකර ලෙස බලපාන බවත් නිදන්ගත රෝගාබාධවලින් වැඩි ප්‍රමාණයක ප්‍රධාන හේතුව ලෙස මෙය හඳුනා ගෙන තිබීමත්, ශ්‍රම බලකායේ ඵලදායිතාවය විශාල වශයෙන් අහිමි වීමටත් මෙය බලපෑමක් වන බවත්, දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් සිදු කළ පරීක්ෂණ ප්‍රතිඵල මත හඳුනා ගෙන තිබුණි. බීඩි නිෂ්පාදනය නියාමනය කිරීමේ දී බීඩි සඳහා බදු පැනවීම තුළින් රජයට ආදායමක් ලැබීම හා එයට සමගාමීව දුම් භාවිත කරන්නන්ගේ සංඛ්‍යාවේ අඩු වීමක් ද අපේක්ෂා කළ හැකි බවත් නිරීක්ෂණය විය.

(ii) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් බීඩි/සිගරට්/සුරුට්ටු සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික 774 ක් නිකුත් කර තිබුණ ද 2022.03.31 දින වන විට ලියාපදිංචිය අලුත් කර ගෙන තිබූ ආයතන සංඛ්‍යාව 509 ක් පමණක් බව නිරීක්ෂණය වූ අතර බලපත්‍රලාභීන් 265 කු ලියාපදිංචිය අලුත් කර නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන්නේ ද යන්න සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පසු විපරමක් සිදු කර නොතිබුණි.

(ඒ) හිඟ ආදායම් - සුරා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මුදල් රෙගුලාසි 176(1) යටතේ මු. රෙ. 128(2) (ඇ) ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව මත්පැන් නිෂ්පාදන ආයතන වෙතින් රු. 5,491,066,488 ක් ද, රා නිෂ්පාදන ආයතන වෙතින් රු. 7,244,372 ක් ද, ස්කාගාර වෙතින් රු. 16,573,335 ක් ද වශයෙන් මුළු හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු. 5,514.884,195 ක් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි අය විය යුතුව පැවතිණි. එය

2021 දෙසැම්බර් 31 දිනට සඳහා වූ රු. 4,550,673,483 ක හිඟ ආදායම සමඟ සැසඳීමේ දී රු.964,210,712 වැඩි වීමක් හෙවත් එය සියයට 17.48 ක වැඩි වීමක් බව නිරීක්ෂණය විය. තව ද මෙම හිඟ බදු වැඩි වීම් සඳහා මූලික හිඟ බදු මුදල් අය නොවීම හේතුවෙන් ඒ සඳහා ගණනය කළ ප්‍රමාද ගාස්තු ද බලපා තිබුණි.

විස්තරය	අයවිය යුතු මූලික බදු මුදල රු.	ප්‍රමාද ගාස්තුව රු.	මුළු මුදල රු.
මත්පැන් නිෂ්පාදන ආයතන	2,038,682,887	3,452,383,601	5,491.066,488
රා නිෂ්පාදන ආයතන	7,241,992	2,380	7,244,372
ස්කාගාර	8,095,690	8,477,645	16,573,335
එකතුව	2,054,020,569	3,460,863,626	5,514.884,195

(ii) සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ආයතන 04 කට අදාළව එකතුව රු 2,389,692,257 ක ආදායමක් වසර 5 කට වැඩි කාලයක් තුළ අය කර ගැනීමට නොහැකි වී තිබුණි. ඉන් ආයතන 03 කට අදාළව නඩු පැවරීමට අවශ්‍ය මූලික කරුණු කෙටුම්පත් කරන අවස්ථාවේ දී හිඟ සුරාබදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පිළිබඳ එකඟතාවය ඇති කර ගෙන තිබුණ ද, අදාළ ආයතනයන් විසින් එම එකඟතාවයන් කඩ කර හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණි.

(iii) නිෂ්පාදන කටයුතු අත්හිටුවා ඇති එක් සැර මත්පැන් නිෂ්පාදන සමාගමක් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා මූලිකව රු 100,000,000 ක් ගෙවීමටත් ඉතිරිය වාරික 24 කින් ගෙවීම සඳහා 2021 ජුනි 23 දින ගිවිසුම් ගත වී තිබුණි. ඉන් මූලික ගෙවීම වාරික 02 ක් යටතේ ඉන් පළමු වාරිකය 2021 ජුනි 30 දින ගෙවීමට කටයුතු ආරම්භ කර තිබුණ ද අමාත්‍ය මණ්ඩල තීරණයක් මත නැවත නිෂ්පාදන අත්හිටු වීමට කටයුතු කර තිබුණි. නැවතත් 2022 වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම සමාගමෙන් අය විය යුතු හිඟ බදු මුදල රු. 1,292,877,138 ක් සහ ප්‍රමාද ගාස්තු රු. 1,456,079,040 ක් පැවතුණි.

(ඕ) හිඟ දුම්කොළ බදු ආදායම්

(i) ආයතන 03 ක් විසින් ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කර තිබුණු බව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත කරන ලද ලිඛිත විමසීම්වල දී ලබා ගන්නා ලද තොරතුරු අනුව හඳුනා ගෙන තිබුණි. සමාලෝචිත

වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ආයතන 03 න් එකතුව රු.9,836,528 ක බදු මුදලක් හිඟව පැවතුණි.

(ii) 2009 ඔක්තෝම්බර් 26 දින ගැසට් පත්‍රයේ පල කරන ලද 2009 අංක 01 දරන දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝගයෙහි 06 වැනි වගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය දරන්නෙක් විසින් දුම්කොල බදු පනත, සුරාබදු ආඥා පනත, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ යම් බද්දක් ගෙවීම පැහැර හරින විට දී ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීම, අත්හිටවනු ලැබීම හෝ දඩ මුදලක් නියම කිරීම සිදු කරනු ලැබිය හැකි වුව ද ඒ පිළිබඳව සලකා බැලීමකින් තොරව මෙම ආයතන 03 සඳහා අවස්ථා 30ක දී ලියාපදිංචි සහතික නිකුත්කර කර තිබුණි.

2.2 වියදම් කළමණාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා රු 376,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් එකතුව රු. 342,448,827 ක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය එකතුව රු 34,051,173 ක් විය. එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් 36 ත් අතර පරාසයක විය.

(ආ) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා රු. 96,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් එකතුව රු.30,419,753 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ත් 56 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී මුල්‍ය කල්බදු ක්‍රමය යටතේ කැබ් රථ 19 ක් හා මෝටර් කාර් රථයක් ලබා ගැනීම වෙනුවෙන් කල්බදු පොළී හා වාරික ගෙවමින් පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් වැය විෂය 2108 යටතේ කල්බදු ණය වාරික සඳහා රු. 28,000,000 ක ප්‍රතිපාදන හා 1406 වැය විෂය යටතේ කල්බදු පොළී ගෙවීම් සඳහා රු. 22,750,000 ක ප්‍රතිපාදන සලසා තිබු අතර, සමාලෝචිත වර්ෂය තුළ දී පිළිවෙලින්, කල්බදු වාරික සඳහා රු.27,659,318 ක් ද, පොළී සඳහා රු.22,695,885 ක වියදමක් ද දරා තිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, නිෂ්පාදනාගාර හා කළමණාකරණ රැස්වීම් සමාලෝචන වාර්තා ඉදිරිපත් කර තිබුණ ද අනෙකුත් පද්ධති සම්බන්ධව සිදු කළ සමාලෝචනවලට අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන 2019 ජුනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ඉ) ඡේදය	6,409,423	(i) මිය ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් සේවයෙන් පහකළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් , විශ්‍රාම ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 18 දෙනෙකුගෙන් එකතුව රු. 6,312,135 ක ණය ශේෂයක් අය විය යුතු පැවතුණි. ඉන් මියගිය එක් නිලධාරියෙකුගේ හා විශ්‍රාම ගිය එක් නිලධාරියෙකුගේ ලැබිය යුතු ශේෂය එකතුව රු. 401,990 ක් වසර 2-3 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. තව ද සේවයෙන් පහකළ නිලධාරීන් 05 ස් දෙනෙකුගේ හා වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.628,329 ක් වසර 5 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික		(iii) කේවළ ණය ශේෂ ලේඛනයේ හඳුනා නොගත් නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 101,288 ක ණය ශේෂයක් පැවතුණි.

	සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i)	මු.රෙ.104(4)	-	WP- CAR-0183 දරන රථය 2021 නොවැම්බර් 15 දින අනතුරට පත් වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අදාළ පරීක්ෂණ කටයුතු නිම කර වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. තව ද අනතුරට සම්බන්ධ රියදුරුට විරුද්ධ නඩුව 2022 ජනවාරි මස අවසන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් රක්ෂණ වන්දි ලබා ගැනීම හා අනතුරට පත් වාහනය අළුත්වැඩියා කිරීම් සිදු වී නොතිබුණි.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය, මු.රෙ.31, මු.රෙ.880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය	-	රජයේ මුදල් පිළිබඳ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරී ලෙස සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තබන බවට වග බලාගත යුතු බව දක්වා තිබුණ ද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එලෙස ඇප ලබාගෙන තිබුණේ නිලධාරීන් නව දෙනෙකුගෙන් පමණි.
(iii)	මු.රෙ.262 (2)		ගෙවන ලද සියලුම වවුචරවලත් ඒවා නහවුරු කෙරෙන ලියවිලවලත් "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුව ද සමාලෝචිත වර්ෂයේ මාස 03 කට අදාළ ගෙවීම් වවුචර් 23 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iv)	මූ.රෙ. 225		සියලු ගෙවීම් වවුචර් නියමිත ආකෘති පත්‍රවල නොරතුරු නිවැරදි ලෙස සම්පූර්ණ කර පිළියෙල කර ගෙවීමට ඉදිරිපත් කළ යුතු වුව ද, අදාළ වවුචර්වල ආකෘති පත්‍ර 36 ක් නිසි ලෙස සම්පූර්ණ කර නොතිබුණි.
(v)	මු.රෙ.702 (3) ප්‍රකාරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12 ඡේදය		සමාලෝචිත වර්ෂය තුළ පවිත්‍රතා, ආරක්ෂක, විදුලි සෝපාන, වායු සම්කරණ, අභ්‍යන්තර දුරකතන පද්ධතිය, ගිනි ආරක්ෂණ ඇතුළු සේවා සැපයුම් 11 ක් සහ ඉදිකිරීම්, මිල දී ගැනීම් කටයුතු සම්බන්ධ ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුව ද ඒ අනුව කටයුතු කර

		නොතිබුණි.
(ඇ)	අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ නියමයට අනුව සුරාබදු ආඥාපනතේ 12 වැනි වගන්තිය	මත්පැන් අපනයනයට අදාළ සුරාබදු අවකරණ සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැකි ඇපකරයක් හෝ බැංකු ඇපයක් සැපයිය යුතු වුව ද, ආයතන 03 ක් විසින් අපනයනයේ දී තබා තිබූ ඇප අපනයන වටිනාකම ආවරණය නොවුණි.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය මු.රෙ.757 (2) (අ)	සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාල, නිෂ්පාදනාගාර සුරාබදු ඒකකවලට අදාළ වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණ වාර්තාවල පිටපත් විණිකාධිපති වෙත 2023 මැයි 25 දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

2.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 04 දෙනෙකු වෙත අවස්ථා 11 ක දී, ලබා දී තිබුණු එකතුව රු.512,900 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

2.6 තැන්පතු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක 6000/0-0-18-0-119 දරන හා අංක 6000/0-0-16-0-126 දරන තැන්පත් ගිණුම් 02 හි පිළිවෙලින් එකතුව රු.3,470,567 තැන්පතු 02 හා එකතුව රු. 1,851,627 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් වසර 2 ක් ඉක්මවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 6000-0-0-1-0-122 දරන ඇප තැන්පතු ගිණුමේ රු.75,689,654 ක් වූ තැන්පතු 1889 කින් තවදුරටත් තැන්පත් කළ පාර්ශ්ව විසින් හිමිකම් නොපාන හා තැන්පතු වශයෙන් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන තැන්පතු හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ අංක 6000-0-0-1-0-122 දරන ඇප තැන්පත් ගිණුමේ සුරාබදු ත්‍යාග අරමුදලට අදාළ, නමුත් අරමුදලේ ගිණුම්වල ඇප තැන්පත් ලෙස ගිණුම් ගත නොකළ නිරවුල් නොවූ කාර්මික අපරාධ 22 ක් වෙනුවෙන් තබන ලද රු.10,032,000 ක් වූ ඇප මුදලින් තවදුරටත් මත්පැන් නිෂ්පාදනාගාර 04 ක් සහ ස්කාගාර එකකට අදාළ නිරවුල් නොවූ කාර්මික අපරාධ 17 ක් සඳහා රු. 8,200,000 ක් අරමුදලේ ඇප තැන්පතු පැවතුනි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන්වලට අදාළව සැර මත්පැන් හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදනයට අදාළව නිෂ්පාදන ආයතනවලට පමණක් ඉලක්ක ලබා දී තිබුණු අතර අනෙකුත් ප්‍රභවයන් 06 ක් සඳහා එසේ ඉලක්ක සැලසුම් කර නොතිබුණි. සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ආදායම් අංශයේ ක්‍රියාකරකම් යටතේ හා වර්ෂයේ කාර්තුමය ප්‍රගති වාර්තාවල මත්පැන් අපනයනය සම්බන්ධ තොරතුරු දක්වා නොතිබුණි.

3.1.2 ව්‍යාපෘති කාර්යසාධනය

(අ) සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED)

අවශ්‍ය දත්ත සමුදායක් ගොඩනැගීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විමසා, යෝග්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම යටතේ දත්ත හුවමාරුව, අවධානම් කළමනාකරණය, ආදායම් සැසඳුම් අරමුණු පෙරදැරිව සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන පද්ධති ව්‍යාපෘතිය, තොරතුරු තාක්ෂණ කළමණාකරණ පද්ධති විෂය පථයට අනුව තොරතුරු තාක්ෂණ අංශය මඟින් ආරම්භ කර තිබුණි. RASED නමින් වූ මෙම පද්ධතිය නව ප්‍රතිසංස්කරණයෙන් යුතු පරිගණක තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ කටයුතු 2020 දෙසැම්බර් සිට ආරම්භ කර ක්‍රියාකාරී ක්ෂේත්‍ර 15කින් ද, අධීක්ෂණය සහ ඇගයීම් මොඩියුල 3 කින් ද, සහයක මොඩියුල 12 කින් ද සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ලේඛනයේ කෙටුම්පත 2022 දෙසැම්බර් 13 දින මුදල් අමාත්‍යාංශයේ තොරතුරු කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඔවුන්ගේ නිරීක්ෂණ සමඟ වැඩි දියුණු කිරීම සඳහා යොමු කර තිබුණි. මූලික ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් පස් දෙනෙකුගෙන් යුතු තාක්ෂණික කමිටුවක් පත් කිරීම සඳහා මුදල් අමාත්‍යාශය වෙත යොමු කර තිබුණි.

මෘදුකාංග පද්ධතියවල සවිස්තරාත්මක අවශ්‍යතා පිරිවිතර සකස් කිරීම ප්‍රමාද වීම. අමාත්‍යාංශයේ විශේෂඥ සේවාව අඛණ්ඩව නොලැබීම සහ යෝජිත උපදේශන සේවාවට අදාළ මුල්‍යමය යෝජනා සඳහා වූ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම ආදී හේතූන් මත මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා සේවාදායකයෙකු සපයා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) **ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය**

බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය අවම කිරීම, සුරාබදු ආදායම තවදුරටත් සුරක්ෂිත කිරීම සහ ව්‍යාජ මත්පැන් වැලැක්වීම මූලික අරමුණ කරගෙන 2017.10.17 දිනැති අමාත්‍ය මණ්ඩලය අනුමැතිය අනුව ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉන්දියානු කොන්ත්‍රාත් සමාගමට ප්‍රදානය කර වසර 05ක් දක්වා 2018.09.21 දින සමාගම සමඟ ගිවිසුම්ගත වී තිබුණි.

ආනයනික මත්පැන් සඳහා 2019.07.20 දින සිට ක්‍රියාත්මක වී තිබූ අතර දේශීය නිෂ්පාදිත මත්පැන් සඳහා 2019.08.20 දින සිට ස්ටිකර් ඇලවීම ආරම්භ කළ යුතුව තිබුණ ද ප්‍රමාද වී 2022 ජනවාරි 03 දින සිට ක්‍රියාත්මත වී තිබුණි. මත්පැන් නිෂ්පාදන ආයතන 08 ක් සඳහා ඩිජිටල් තාක්ෂණය ද අනෙකුත් නිෂ්පාදන ආයතන අතින් ස්ටිකර් ඇලවීම ද ක්‍රියාත්මක වූ අතර, වෙළඳපොලේ පවතින මත්පැන් තොග සඳහා ආරක්ෂිත ස්ටිකර් ඇලවීම 2022 අප්‍රේල් මස 01 වන දිනට පෙර සංශෝධනය වී ක්‍රියාත්මක වී තිබුණි. ස්ටිකර් ආදායමට අදාළ ආදායම් වාර්තා හා මාසික ගිණුම් සාරාංශය අනුව 2021 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා දේශීය සහ විදේශීය මත්පැන් සඳහා භාවිත කිරීමට මුද්‍රිත ස්ටිකර් සහ ඩිජිටල් ස්ටිකර් 555,371,052 ක ප්‍රමාණයක් නිකුත් කර තිබූ අතර, රු. 1,155,016,308 ක ආදායමක් උපයා තිබුණි. සුරාබදු නිවේදන 07/2021 විධිවිධාන මාස 06 ක කාලයකට පෙර දැනුම් දිය යුතු වුව ද, නිෂ්පාදන ආයතන 03 ක ඩිජිටල් තාක්ෂණය ක්‍රියාත්මක වී ඉතා කෙටි කාලයකින් ආරක්ෂිත ස්ටිකර් ඇලවීමේ ක්‍රමවේදයට අනුගමනයට අනුමැතිය දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) භාවිත කරන ලද ස්ටිකර්වලට අදාළව නව නිර්මාණ සැලැස්මක් නිර්මාණය කිරීම සම්බන්ධව පසු විපරමක් වාර්තා නොවීම. කොන්ත්‍රාත් සමාගම සමඟ පවතින ගිවිසුම 2023 සැප්තැම්බර් මස අවසන් වන බැවින් ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යෑම සම්බන්ධව තාක්ෂණික හා කාර්මික දෝෂයන් නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස දැනුවත් කිරීමක් කළ ද. භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ලිපියකින් දැනුවත් කිරීමක් පමණක් සිදු කර තිබුණි.

(ii) පාරිභෝගිකයා වෙත ළඟා වීමට පෙර, සෑම බෝතලයකම හෝ කෑන් එකක් මතම අනුමත ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම අත්‍යවශ්‍ය සාධකයක් වුව ද නිෂ්පාදනාගාරවල සවිකර ඇති ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රිය වීම හේතුවෙන් ඩිජිටල් සලකුණු නොමැතිව වෙළඳපොළට නිකුත් නොකළ යුතුය යන විධානය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම.

(iii) ඩිජිටල් සලකුණු ක්‍රමවේදය යටතේ ස්ටිකර් ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රධාන සමාගමක එක් නිෂ්පාදනාගාරයක සිදු කළ නියදි විගණන පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගමේ අධීක්ෂණය යටතේ සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව තිබූ අතර, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, යන්ත්‍රය ස්ථාපනය කරන ලද 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 කාලය තුළ එනම්, ආසන්න මාස 13 ක් තුළ අවස්ථා 813 ක දී මුද්‍රණ යන්ත්‍රය ක්‍රියාවිය පැවතුනි. සුරාබදු නියෝග අංක 07/2021 නියෝගයට අනුකූල නොවන අයුරින් 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 දක්වා කාලය තුළ මත්පැන් බෝතල් 4,904,369 ස්ටිකර් මුද්‍රණය නොවී වෙළඳපොළට නිකුත් වී තිබුණි.

(iv) මත්පැන්, ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් ලෙස සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා APP එකක් හඳුන්වා දී තිබුණ ද SFMS හි වාර්තාකරණ මොඩියුලයෙහි (MIS) ගැටළු පැවතුනි. සංශෝධිත මෘදුකාංග පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීමේ ප්‍රමාදය මත පරීශීලකයන්ගේ දැනුම නොමැතිකම මත මෙහෙයුම්වලදී ගැටළු පැන නැඟී තිබීම. ව්‍යාපෘති කළමනාකරුවෙකු මෘදුකාංග විශ්ලේෂකයෙක් අනියුක්ත නොකිරීම සහ SFMS හි වාර්තාකරණ මොඩියුලය (MIS) සංවර්ධනය කිරීම සිදු කර නොමැති වීම නිසා අවශ්‍ය විටෙක දී මෙහෙයුම් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීමට නොහැකි වීම. කොන්ත්‍රාත් සමාගම, සුරාබදු දෙපාර්තුමේන්තුවේ හෝ නිෂ්පාදකයන්ගේ භෞතික තොග සත්‍යාපනය සමඟ සංසන්දනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් මෘදුකාංගය මඟින් සලසා නොතිබුණි.

(v) මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තාවක් මොඩියුලය මඟින් ලබා ගැනීමට පහසුකම් සලසා නොතිබීම. අවශ්‍ය බිඳ වැටීම් සහිතව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා MIS මොඩියුලය මඟින් නිරන්තරයෙන් කාර්මික ගැටළු පැන නැඟීම, සවිස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සැපයීම වැනි අවශ්‍ය පහසුකම් සලසා නොතිබීම සුරාබදු දෙපාර්තුමේන්තුව සඳහා තත්‍ය කාලීන ,දෛනික හා කලාන්තර මෙහෙයුම් නිරීක්ෂණය කිරීම සඳහා විස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සවි කිරීම සම්පූර්ණ කර නොතිබීම. Track & Tracing යන්ත්‍ර ලබා දුන්න ද එහි මෘදුකාංග නිසි ආකාරව ක්‍රියාත්මකව නොතිබුණි. මුද්‍රණය වීමෙ දී ප්‍රතික්ෂේප වීම් හඳුනා ගැනීම සඳහා උපාංගයක් හඳුන්වා දී නොතිබුණි.

(vi) මුද්‍රණය නොකළ හෝ අර්ධ වශයෙන් මුද්‍රණය කරන ලද බෝතල් සහ කෑන් හඳුනා ගැනීම සඳහා යන්ත්‍රයක් හෝ උපාංගයක් හඳුන්වා දී නොතිබීම ඩිජිටල් සලකුණු ස්වයංක්‍රීයව සක්‍රීය

වන බව කොන්ත්‍රාත් සමාගම ප්‍රකාශ කළ ද මෘදුකාංගය තුළින් තහවුරු කර ගැනීමට හැකිව න පරිදි ක්‍රමවේදයක් සලසා නොතිබීම ප්‍රධාන කාර්යාලයේ සැපයුම්දාම නියාමන අංශයේ ක්‍රියාවලිය බිඳ වැටුනු අවස්ථා පිළිබඳව තොරතුරු ලේඛන ගත කර පවත්වා ගෙන නොයන බව නිරීක්ෂණය විය.

(vii) නියෝග අංක 7/2021 සුරාබදු නිවේදනයේ 5(2) රීතියට අනුව ගුවන් තොටුපළ සහ වරායන් ඇතුළු අනිකුත් ස්ථානවල ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ආරක්ෂිත සළකුණු ඇලවීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන බව විගණනයට තහවුරු නොවුණි. තව ද තානාපති සේවය, ශ්‍රී ලංකන් එයාර් ලයින් හා ශ්‍රී ලංකා ක්ටරින් යන ආයතන තීරු බදු රහිත ආයතන නොවූව ද ස්ටිකර් කමිටුවේ නිර්දේශය මත ස්ටිකර් යෙදීම පිළිබඳ පසු විපරමක් සිදු කරනොතිබුණි.

(viii) ස්ටිකර් අතින් ඇලවීමේ අවශ්‍යතාවය පුරෝකථනය කිරීම සඳහා සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 22 ක් සහ ධාන්‍ය නිෂ්පාදන සමාගම් 02 කට අදාළ නිෂ්පාදන අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී ඇණවුම් කරන ප්‍රමාණයට අදාළව මත්පැන් නිෂ්පාදකයින් සතු තොග ප්‍රමාණය සහ වෙළඳපොල තුළ පවතින තොග ප්‍රමාණය පිළිබඳ නිවැරදි පුරෝකථනයක් සකස් කළ බවක් නිරීක්ෂණය නොවිය. තව ද පවතින තොග සඳහා ස්ටිකර් ඇලවීම 2021 ඔක්තෝම්බර් 16 දිනැති අංක 10/2021 දරන සුරාබදු නිවේදනය මඟින් 2022 අප්‍රේල් 01 දිනට පෙර නිම කිරීම දක්වා නැවත සංශෝධනය වුව ද 2022 වර්ෂයේ තොග අවශ්‍යතා හා ගැළපෙන ස්ටිකර් තොග අවශ්‍යතාවයන් කොපමණ ද යන්න ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ix) 2022 ඔක්තෝම්බර් 14 දින දක්වාම ඉන් සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 08 ක් වෙත නිකුත් කර තිබූ ආරක්ෂිත සලකුණු එකතුව 16,595,500 ක් සම්බන්ධයෙන් අලවන ලද මුළු ස්ටිකර් ප්‍රමාණය සම්බන්ධව කිසිදු වාර්තාවක් සහ ඉතිරි තොග සැපයුම්දාම අංශය වෙත හෝ ස්ටිකර් අංශය වෙත භාර දී නොතිබුණත්, සහකාර සුරා බදු කොමසාරිස් බස්නාහිර පලාත් (I) සහ (II) කාර්යාලය වෙත ලබා දී තිබූ එකතුව 7,435,000 ක ස්ටිකර් ප්‍රමාණයෙන් එකතුව 213,540 ක් නැවත භාර දී තිබුණ ද ඉතිරි ස්ටිකර් තොගය වන එකතුව 7,221,460 ක ප්‍රමාණය පිළිබඳව අලවන ලද බවට හෝ කාර්යාල සතුව පවතී ද යන්න විගණනයට තහවුරු නොවීම සහ බස්නාහිර පලාත් (III) සහ මධ්‍යම පළාත වෙත ලබා දී තිබූ එකතුව 10,090,000 ක ස්ටිකර් ප්‍රමාණයෙන් එකතුව 6,402,590 ක් අලවන ලද බවට තහවුරු කර තිබූ අතර, ඉන් එකතුව 2,757,410 ක් නැවත භාර දී තිබුණ ද ඉතිරි 930,000 ක ප්‍රමාණයක් නැවත භාර දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50,000 ක සීමාවට

ආසන්නව තබා ගැනීමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය විසින් අවධාරණය කර තිබුණි. වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුවකට 10,434 බැගින් අපරාධ ග්‍රහන ඉලක්ක 41,736 ක් 2022 වර්ෂය සඳහා සැලසුම් කර තිබුණි. එය පළමු කාර්තුව තුළ දී ග්‍රහන ඉලක්ක 41,108 දක්වා 628 කින් වැඩි කිරීමෙන් ද දෙවන කාර්තුව තුළ දී ග්‍රහන ඉලක්ක 32,886 ලෙස 8,222 කින් අඩු කර නැවතත් 27,748 ක් දක්වා ඉන්ධන හිඟය, විදුලි බල ඇණ හිටීම් සහ ආර්ථිකමය පසුබෑම හේතුවෙන් 5,138 කින් අඩු කර සංශෝධනය වී තිබුණි. කෙසේ වුව ද අපරාධ ග්‍රහන 35,381 ක ප්‍රමාණයක් සිදු කර තිබුණු බව පහත පරිදි නිරීක්ෂණය විය.

විස්තරය	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන් වන කාර්තුව	සිව්වන කාර්තුව	එකතුව	සංශොධිත වෙනස
----------	--------	--------	---------	-------	--------	-------
අපරාධ ග්‍රහනය (CR) සම්බන්ධ 2022 වර්ෂයේ ප්‍රගති වාර්තාවේ ඉලක්ක	10,434	10,434	10,434	10,434	41,736	-
පළමු වරට සිදුකල කාර්තුමය සංශෝධිත ඉලක්ක	10,277	10,277	10,277	10,277	41,108	(628)
අවසන් වරට සිදුකල කාර්තුමය සංශෝධිත ඉලක්ක	6,166	6,166	7,708	7,708	27,748	(13,360)
සිදුකල අපරාධ ග්‍රහනය කිරීම්	7,385	9,264	7,918	10,814	35,381	7,633

(i) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සුරාබදු ස්ථාන විසින් සිදු කර තිබුණු අපරාධ ග්‍රහන පරීක්ෂාවේ දී සුරාබදු ස්ථාන 14 ක 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේ දී සිදු කල ග්‍රහනයන් සියයට 17 ත් 49 ත් අතර පරාසයකින් අඩු වීමක් නිරීක්ෂණය විය.

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පැවරී ඇති පනත් 04 යටතේ සමාලෝචිත වර්ෂයේ සිදු කළ සමස්ථ අපරාධ ග්‍රහනයන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අපරාධ ග්‍රහනයන් 3,727 කින් හෙවත් සියයට 10 ප්‍රතිශතයකින් අඩු වීමක් නිරීක්ෂණය විය.

(ඇ) 2022 ක්‍රියාකාරී සැලැස්මේ වර්ෂයට සැලසුම් කළ කාර්මික අපරාධ ග්‍රහන ප්‍රමාණය 3,600 කාර්තුමය ප්‍රගති වාර්තා අනුව පිළිවෙලින් 1,244 කින් වැඩි වී හා නැවත 1,574 කින් අඩු වී 3,270 ක් ලෙස සංශෝධනය වී තිබුණි. කෙසේ වුවද අපරාධ ග්‍රහන 4,155 ක ප්‍රමාණයක් සිදු කර තිබුණි.

විස්තරය	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	සිව්වන කාර්තුව	එකතුව	වෙනස
අපරාධ ග්‍රහනය (TCR) සම්බන්ධ 2022 වර්ෂයේ ප්‍රගති වාර්තාවේ ඉලක්ක	900	900	900	900	3,600	-
පළමු වරට සිදුකළ කාර්තුමය ප්‍රගති වාර්තාවේ	1,211	1,211	1,211	1,211	4,844	1,244
සංශෝධිත ඉලක්ක දෙවන වරට සිදුකළ කාර්තුමය ප්‍රගති වාර්තාවේ	727	727	908	908	3,270	(1,574)
සිදුකල කාර්මික අපරාධ ග්‍රහනය කිරීම්	455	1,558	727	1,415	4,155	885

කාර්මික අපරාධ ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේ දී සුරාබදු ස්ථාන සඳහා 2022 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් සියයට 33 කින් අඩු කර තිබියදීත් ඉලක්ක සැපිරීම සියයට 100 කට වඩා අඩු වී තිබුණු සුරාබදු ස්ථාන 13 ක් නිරීක්ෂණය විය.

(ඉ) ස්කාගාර 02 ක් සඳහා 2021 වර්ෂය සහ 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරය විසින් නිකුත් කරන පරිසර ආරක්ෂණ වාර්තාව ලබා ගෙන නොතිබිය දී, පිළිවෙලින් බලපත්‍ර කාලය අවස්ථා 11 ක දී සහ අවස්ථා 09 ක දී 2021 සහ 2022 වර්ෂවල දී ස්කාගාර බලපත්‍ර ලබා දී පිළිවෙලින් බලපත්‍ර කාලය අවස්ථා 11 ක දී සහ අවස්ථා 09 ක දී දීර්ඝ කර තිබුණි. ඒ අනුව ජාතික පාරිසරික පනතේ විධිවිධානයන්ට අනුව ඝන අපද්‍රව්‍ය සහ අපදියර බැහැර කිරීම සඳහා වූ ක්‍රමවේදයේ අනුකූලතාවයන් තහවුරු කර ගන්නේ කෙසේද යන්න විගණනයට තහවුරු නොවුණි.

(ඊ) නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැපයීමටත්, නීති විරෝධී වෙළඳාම මැඩලීමටත්, අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළව දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.

(උ) ප්‍රමිතියෙන් තොර මත්පැන් නිෂ්පාදනය මඟින් ඇතිවිය හැකි අවධානම අවම කිරීම සඳහා දේශීය මත්පැන් හා මෙරට නිෂ්පාදිත විදේශ මත්පැන් හා ධාන්‍ය මත්පැන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණ ආයතනය සමඟ එක්ව මත්පැන් වර්ග 11 ක් සඳහා නිර්ණායක 16 ක් යටතේ

ප්‍රමිතීන් සකස් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදන විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ප්‍රමිතින් සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් වී නොතිබුණි. තව ද මහ රා , සකේ වයින් සඳහා ප්‍රමිති මෙතෙක් සකස් කර නොතිබූ අතර ඒ හේතුවෙන් ඒ සම්බන්ධ විධිමත් නියාමනය ද ප්‍රමාද වෙමින් පැවතිණි.

3.1.5 වත්කම් කළමනාකරණය

සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් වාහන 05 ක් අළුත්වැඩියා කටයුතු සඳහා සේවා ආයතන 05 කට භාර දී මාස 05 ත් 16 ත් අතර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම අළුත්වැඩියා කටයුතු නිම කර භාර දී නොතිබුණු අතර වාහන 07 කට අනතුරු සිදු වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව අරමුණු 15කට අදාළව ලභා කර ගත යුතු ඉලක්ක 37කින් සමාලෝචිත වර්ෂය සඳහා අරමුණු 05 ක් යටතේ ඉලක්කයන් 07 ක් හඳුනා ගෙන තිබුණු අතර එහි ඇතුළත් පාරිසරික හා සමාජීය ආරක්ෂණය සඳහා හඳුනා ගත් තිරසර සංවර්ධන අරමුණු ලභා කර ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා රැස්වීම්වල දී ද අවධානය යොමු කර නියෝග ලබා දී තිබුණි. රසායනාගාරයක් ස්ථාපිත කිරීම හා අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදන වන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය ආදී කේෂත්‍රයන්ට අදාළ ප්‍රගතිය විගණනයට වාර්තා නොවිණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) සුරාබදු ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගනු ලබන 1913 මෙහෙයුම් මැදිරිය වෙත 2022.01.01 දින සිට 2022.12.31 දක්වා කාලපරිච්ඡේදය තුළ පැමිණිළි 1,552 ක් ලැබී තිබුණු අතර, මින් 210 ක් විශේෂ මෙහෙයුම් ඒකකය වෙත ද පැමිණිළි 1,342 ක් ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉන් සාර්ථක පරීක්ෂණ සිදු කර තිබුණේ ප්‍රාදේශීය කාර්යාල 419 ක් සහ විශේෂ මෙහෙයුම් ඒකක වලින් 48 ක් බව නිරීක්ෂණය විය..

(ආ) 2020 සිට 2022 වර්ෂය දක්වා සමාලෝචිත වර්ෂයට අදාළව තොරතුරු ඉල්ලීම් 53 සිදු කර තිබූ අතර ඉන් ඉල්ලීම් 45ක් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන සැළසුම් මඟින් ක්ෂේත්‍ර 22 කට අදාළව විගණන වැඩසටහන් 36 ක් සැලසුම් කර තිබුණ ද වාර්තා 16 ක පිටපත් විගණකාධිපති වෙත ලැබී තිබුණි. එම වාර්තා මඟින් පෙන්වා දී තිබුණු ගිණුම් පරිපාලන ,මෙහෙයුම්, ආදායම් නීති ක්‍රියාත්මක කිරීම් ආදි ක්ෂේත්‍රවල පාලන පද්ධතීන්වල වූ අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට වාර්තා නොවුණි.

6. මානව සම්පත් කළමනාකරණය

(අ) සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ප්‍රධාන කාර්යාලය ඇතුළු දිවයින පුරා පිහිටි සහකාර සුරාබදු කාර්යාල 13 කින් සුරාබදු අධිකාරී කාර්යාල 30 කින් සුරාබදු ස්ථාන 56 කින් විශේෂ මෙහෙයුම් ඒකක 5 කින් හා මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ ඒකකයකින් සමන්විතව දිප ව්‍යාප්ත සේවාවක් ඉටු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	68	30	38
තෘතියික මට්ටම	381	304	77
ද්විතික මට්ටම	1048	845	203
ප්‍රාථමික මට්ටම	142	83	59
එකතුව	1639	1262	377

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව, අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරක් වසර 03 ක සිට ද, සුරාබදු කොමසාරිස් තනතුරු 01 ක වසර 04 ක සිට ද, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 05 ක වසර 01 ත් 04 ත් අතර කාලයක සිට ද, තනතනතුරු පුරප්පාඩු වෙමින් පැවති අතර ඒ සඳහා පිළිවෙළින් රාජකාරි ආවරණය කිරීම් යටතේ නිලධාරීන් 05 දෙනෙකු වැඩ බැලීම් යටතේ එක් නිලධාරියෙකු මඟින් ද රාජකාරි ඉටු කරමින් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පාලන තනතුරට අදාළ රාජකාරි කටයුතු කිසිදු නිලධාරියෙකුගෙන් ආවරණය වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 38 ක සහ තෘතීය මට්ටමේ තනතුරු 77 ක පුරප්පාඩු පැවතුණි. මෙය දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යසාධනයට අහිතකර ලෙස බලපා හැකි බව නිරීක්ෂණය විය.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත :- 1. අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2. ලේකම්, මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

01

මගේ අංකය
எனது இல.
My No. පීඑඅාර්/ඊ/ඊඑක්ස්ඩී/ආර්එෆ්/ 2022/31

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 29 දින

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු තෑගි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

CFO.

ඩබ්ලිව් පී.ඒ.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
පීයූආර්/ඊ/ඊඑක්ස්ඩී/ආර්එෆ්/ 2022/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2023 මැයි 29 දින

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු තෑගි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සුරාබදු තෑගි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 හි 71 සහ 76 වන ඡේද අනුව ඵලදායි ජීවිත කාලයන් හඳුනා ගෙන එම ඵලදායි ජීවිත කාලය පුරා ක්‍රමවත් පදනමක් මත ක්ෂය කල යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් වර්ගීකරණ 07 ක් යටතේ වූ රු.12,881,878 ක් වූ ජංගම නොවන වත්කම් වල ඵලදායි ජීව කාලය හඳුනානොගෙන හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර තිබුණි.ඒ හේතුවෙන් ඇතැම් වත්කම් භාවිත කල හැකි කාලය ඉක්මවා හා එම වත්කම්වල ධාරණ අගය නොසැලකිය හැකි අගයක් දක්වා ක්ෂය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 හි 72 වන ඡේදය අනුව ඉඩම් හා ගොඩනැඟිලි වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 47,134,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.තවද ප්‍රමිතයේ හි 64 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ගොඩනැගිලි වෙනුවෙන් ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ජංගම නොවන වත්කම් උපලේඛනයේ වත්කම් වලට අදාල සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු. 141,718,128 පිරිවැය වෙනුවට රු.63,033,460 ක ධාරණ අගයන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබූ රු. 49,687,107 ක් වූ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් හා රු.18,974,695 ක් වූ භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද ක්ෂය සංචිත අරමුදලේ වර්ෂ අවසාන ශේෂය පිළිවෙලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හා අවසාන මුදල් ශේෂය යටතේ දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ක්ෂය සංචිත අරමුදලට මාරුකර තිබුණු රු. 3,276,488 ක ජංගම නොවන වත්කම් ක්ෂය වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දී රු.500,000 වූ ඇප තැන්පතුවක් සමථ ආදායම් ලෙස ගිණුම්ගත වීමේ දෝෂය සමාලොචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල නිවැරදි කර තිබුණ ද එය නැවත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද නිරූපණය කර තිබුණි.

(උ) පෙර වර්ෂය තුල සිදු වී තිබූ ගිණුම්කරණ දෝෂයන් වූ රු.194,314 ගෙවිය යුතු තෑගි මුදල් වැඩියෙන් සටහන් වීම , කාර්යාල උපකරණ රු.3,000 ක් වැඩියෙන් සටහන් වීම හා දුම්කොළ අරමුදලට ගෙවිය යුතු රු. 95,550 ක් අඩුවෙන් සටහන් ගැලපීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 03 හි 47 ඡේදයේ (අ) හි පරිදි ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුල දක්වා නොතිබුණි.

(ඌ) ප්‍රාදේශිය සුරාබදු කාර්යාල වලට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ මුදලින් ලැබී තිබුණු රු. 9,651,195 සමථ ගාස්තු හා රු. 960,400 ක් වූ සිගරට් දඩ ආදායම් මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(එ) සුරාබදු දෙපාර්තමේන්තුවේ අංක 6000-0-0-001-0-122-0 දරන ඇප තැන්පත් ගිණුමේ මත්පැන් නිෂ්පාදනාගාර 04 ක් සහ ස්කාගාර එකකට අදාළ නිරවුල් නොවූ කාර්මික අපරාධ 17 ක් සඳහා රු. 8,200,000 ක් වූ කාර්මික අපරාධ වෙනුවෙන් වූ ඇප තැන්පත් අරමුදලේ ඇප තැන්පතු ලෙස දක්වා නොතිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ බැරකම් වෙන් කිරීමකින් තොරව ඉකුත් වර්ෂයට අදාලව සෘජු ග්‍රහණ සඳහා ගෙවීම් රු. 6,027,639 ක් සහ අනිකුත් කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා ගෙවීම් රු. 153,640 ක් සමාලෝචිත වර්ෂයේ සමථ තැගි මුදල් ගෙවීම් තුල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

	නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද	ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තෑගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. මේ දක්වාම වාර්ෂිකව වෙන්කල රු.21,440,516 ක් වූ මුදල් අරමුදලට ගෙවිය යුතු මුදලක් ලෙස දිගුකාලීන බැරකම් යටතේ දක්වා තිබුණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛණය	.
(i)	මුදල් රෙගුලාසි 877 (2)(ඇ)	2022 වර්ෂයේ සුරාබදු තෑගි අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ අරමුදලේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද මේ දක්වා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii)	මු.රෙ.877(2) (අ) විධි විධාන	සමාලෝචිත වර්ෂය දක්වාම තැගි අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුන අතර සමාලෝචිත වර්ෂය තුලදී රු.169,140,963 ක් වූ තැගි අරමුදලට ලැබීම් හා අරමුදලේ ගෙවීම් රු.119,261,364 ක් සුරාබදු දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් මඟින් සිදුකර තිබුණි.

3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) තැන්පත් ගිණුම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක භාණ්ඩාගාරයේ පැවති අරමුදලේ තැම්පත් ගිණුමේ ශේෂ සැසඳීමේ දී 2018 වර්ෂයේ සිට 2021 දක්වා ක්‍රමයෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 34.96 වර්ධනයක් නිරීක්ෂණය විය.

(ආ) ශුද්ධ වත්කම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක සුරාබදු තැගි අරමුදලේ ශුද්ධ වත්කම් සැසඳීමේ දී 2019 සිට 2021 වර්ෂය දක්වා අරමුදලේ මුල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් එම වර්ෂ වල ශුද්ධ වත්කම් ද ක්‍රමයෙන් සැලකිය යුතු පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් සියයට 19.17 කින් වැඩිවී තිබුණි.

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවය කරන හා කළ සියළුම නිලධාරීන් දිරිදීමනා ගෙවීම සඳහා වැයකර ඇති රු. 34,597,538 ක මුදලින් රු. 19,597,538 ක් තැගි අරමුදලින් දරා තිබුණු අතර පෙබරවාරි මාසය සඳහා සියළුම නිලධාරින්ට දිරිදීමනා ගෙවීම් සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් තැගි අරමුදලේ ශේෂයෙන් රු. මිලියන 37 ක් ලබාගැනීමට දී තිබූ අනුමැතිය මත තැගි අරමුදලින් රු. 34,645,515 ක් ගෙවා තිබුණි. තවද පෙර වර්ෂ වල සහ සමාලෝචිත වර්ෂයේ දිරි දීමනා සඳහා හිමිකම් නොපෑ නිළධාරින්ට ද තැගි අරමුදල් අවස්ථා 17 ක දී රු. 1,133,785 ක් ගෙවීම් ඇතුළුව සියළුම නිළධාරීන්ට දිරි දීමනා ගෙවීම් සඳහා රු.55,376,838 ක් තැගි අරමුදලින් දරා තිබුණි.

(ආ) 2019.12.27 දිනැති සුරාබදු චක්‍රලේඛ අංක 10/2019/හි 02 ඡේදය පරිදි දැනට පවතින සුරාබදු නිවේදන අංක 818 සංශෝධනය කිරීමට යටත්ව, 2019 මාර්තු මස සිට දෙපාර්තමේන්තුවේ සියළුම නිළධාරීන්ට දිරි දීමනා ගෙවීම් සඳහා තැගි අරමුදලින් දායක වී තිබුණු අතර 1994

මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය ක්‍රියාත්මක වී වසර 27 ක් ඉක්මවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ සංශෝධනයන් සිදු වී නොතිබුණි.

(ඇ) අංක 818 දරණ සුරාබදු නිවේදනය ප්‍රකාරව තෑගි අරමුදලේ කාරක සභාවේ වර්තමාන කමිටු සාමාජිකයන් පත්කිරීම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂය තුල එම කමිටුවේ අයවැය ලේඛනය, ක්‍රියාකාරී සැලැස්ම අනුව භෞතික හා මූල්‍ය ප්‍රගතිය මූල්‍ය ,මෙහෙයුම් කටයුතු, සමාලෝචනය පරීක්ෂාව සඳහා පවත්වා තිබුණු රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි.

3.4 කාර්යසාධනය

(අ) කාර්මික අපරාධ ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේදී සුරාබදු ස්ථාන සඳහා 2022 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් සියයට 33 කින් අඩුකර තිබියදීත් ඉලක්ක සැපිරීම සියයට 100 කට වඩා අඩු වී තිබුණු සුරාබදු ස්ථාන 13 ක් නිරීක්ෂණය විය.

(ආ) කාර්මික අපරාධ ග්‍රහණ දඩ මුදල් විශ්ලේෂණය පරීක්ෂාවේ දී 2011 අගෝස්තු 11 දිනැති අංක 03/2011 දරන සුරාබදු චක්‍රලේඛය ප්‍රකාරව වර්ගීකරණ 09 ක් යටතේ වූ ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් 25 හා සාමාන්‍ය ගණයේ වැරදි 35 ක් දක්වා තිබුණු අතර 2022 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා අදාලව විගණනයට ලද තොරතුරු අනුව කාර්මික අපරාධ ග්‍රහණ 3,627 ක් ත්‍යාග මුදල් ගෙවීම් සඳහා පදනම් කර තිබුණි. ඉන් 2,572 ක් හෙවත් සියයට 71 ක ප්‍රතිශතයක් සාමාන්‍ය වැරදි සඳහ වූ දඩ නියෝජනය වූ අතර ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් සඳහා වූ දඩ නියෝජය වූයේ 1,055 ක් හෙවත් සියයට 29 ක ප්‍රතිශතයක් පමණක් බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 කට අදාලව කාර්මික අපරාධ ග්‍රහණ සම්බන්ධව සුරාබදු දෙපාර්තමේන්තුවේ නිති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ග්‍රහණ සම්බන්ධ තොරතුරු අනුව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැටලීම් ඉලක්ක ලබාදීම් වාර්ෂිකව ක්‍රමයෙන් අඩු වී තිබුණි. තවද ඉලක්කගත ග්‍රහනවලට සාපේක්ෂව සිදු කළ ග්‍රහණ ප්‍රමාණය වැඩි වී තිබුණද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සිදුකළ ග්‍රහණ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී තිබුණි. මුලින් සැලසුම් කළ ඉලක්කගත ග්‍රහන සංඛ්‍යාව සංශෝධනය වී 2021 සහ 2022 වර්ෂ වල ඉලක්ක ග්‍රහන අඩු වුවද එම වර්ෂ වල තත්‍ය ග්‍රහණ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. එය 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 1 ක වැඩිවීමකි.

3.5 අයවැය ලේඛනමය පාලනය

(අ) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ සඳහන් සුරාබදු තෑගි අරමුදලේ පරමාර්ථයන් වලින් පුහුණු කිරීම් සහ අධ්‍යාපනික කර්තව්‍යන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද සහ සුභ සාධක වැඩසටහන්, ප්‍රසංශනීය වැඩ,නිර්හීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියා සහ විශේෂ රාජකාරීන් හෝ විශේෂ වැටලීම් සඳහා දෙපාර්තමේන්තුවට දරන්නට හැකි වියදම් පියවීම.යන අරමුණු සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් රු. 4,000,000 ක් වෙන් කර තිබුණද සමාලොචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ එම කාර්යයන් කිසිවක් ඉටු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී ආදායම් විෂයන් 02 ක සියයට 6 සිට සියයට 14 දක්වා සහ වියදම් විෂයන් 08 ක සියයට 10 සිට සියයට 452 දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති